
රහස්‍ය ලේඛනයකි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ. පෙළ) විභාගය - 2025

# 21 - ආර්ථික විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය



| 2025 වසර මුල් භාගයේ වැඩිම පාඩු ලැබූ රාජ්‍ය ව්‍යවසායන් (රු. බිලියන) | | 2025 වසර මුල් භාගයේ වැඩිම ලාභ ඉපයූ රාජ්‍ය ව්‍යවසායන් (රු. බිලියන) | |
|---|---|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලය | -13.2 | ලංකා බැංකුව | 61.1 |
| ශ්‍රී ලන්කන් ගුවන් සේවය | -10.7 | සේවක භාරකාර අරමුදල් මණ්ඩලය | 33 |
| ලංකා සීනි සමාගම | -2.6 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 31.1 |
| ලංකා පොහොර සංස්ථාව | -11 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 29.2 |
| ලංකා පොහොර සමාගම | -1 | මහජන බැංකුව | 28.1 |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1 | ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය | 17.7 |
| රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | -0.64 | ලංකා ඛනිජ තෙල් සංස්ථාව | 17 |
| ස්වාධීන රූපවාහිනී ජාලය | -0.58 | ගුවන් තොටුපොළ හා ගුවන් සේවා අධිකාරිය | 9.8 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | -0.33 | ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 8.1 |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -0.31 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 3.3 |

මෙය උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂකවරුන් සමග සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි ඇතැම් වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025

විෂය අංකය / பாட இலக்கம்: **21**

විෂයය / பாடம்: **ආර්ථික විද්‍යාව**

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 1 | 31. | 4 | 41. | 4 |
| 02. | 5 | 12. | 2 | 22. | 2 | 32. | 2 | 42. | 3 |
| 03. | 3 | 13. | 2 | 23. | 4 | 33. | 2 | 43. | 4 |
| 04. | 3 | 14. | 3 | 24. | 1 | 34. | 3 | 44. | 3 |
| 05. | 1 | 15. | 4 | 25. | 1 | 35. | 2 | 45. | 4 |
| 06. | 4 | 16. | 2 | 26. | 3 | 36. | 1 | 46. | 4 |
| 07. | 1 | 17. | 3 | 27. | 5 | 37. | 2 | 47. | 2 |
| 08. | 3 | 18. | 5 | 28. | 4 | 38. | 5 | 48. | 1 |
| 09. | 5 | 19. | 2 | 29. | 2 | 39. | 5 | 49. | 2 |
| 10. | 1 | 20. | 3 | 30. | 4 | 40. | 2 | 50. | 1 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 x 50 = 50



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

- ※ 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ※ ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 01 වන ප්‍රශ්නය

**'අ' උප කොටස**

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

1. (i) දේපළ සම්පත් සහ මානව සම්පත් නිර්වචනය කර ඒවාට එක් උදාහරණය බැගින් දෙන්න. (ලකුණු 04යි)

   (ii) හිඟකම හේතුවෙන් ආවස්ථික පිරිවැය පැනනගිනුයේ කෙසේ ද? පුද්ගලයන් හා රජයන් මුහුණ දෙන ආවස්ථික පිරිවැය සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 04යි)

   (iii) නූතන නිෂ්පාදන පද්ධති තුළ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රම විභාජනය දායක වන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03යි)

   (iv) වෙළෙඳපොළ ආර්ථික පද්ධති සහ විධාන ආර්ථික පද්ධති අතර ආර්ථික නිදහස හා පාරිභෝගික ස්වාධිපත්‍යය වෙනස් වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

   (v) වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී මිල යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව අගයන්න. (ලකුණු 05යි)

01.(i) - දේපළ සම්පත් යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී භාවිත කෙරෙන මානුෂීය නොවන භෞතික (ද්‍රව්‍යාත්මක) සහ භෞතික නොවන වත්කම් ය. (ලකුණු 01යි)

- නිදසුන් : ඉඩම්, ප්‍රාග්ධනය, ස්වාභාවික සම්පත්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, ස්වාධිකාර

+ භූමිය

(ඕනෑම සමාන නිදසුනකට ලකුණු 01යි)

- මානව සම්පත් යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී භාවිත කෙරෙන මිනිසුන්ගේ කායික හා මානසික ප්‍රයත්නය වේ. (ලකුණු 01යි)

A

- නිදසුන් : ගුරුවරයා, කළමනාකරුවා, කම්කරුවා, වෛද්‍යවරයා

+ ශ්‍රමය
+ ව්‍යවසායකත්වය

(ඕනෑම සමාන නිදසුනකට ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(ii) - හිඟකම යනුවෙන් අදහස් කරනුයේ අසීමිත මිනිස් වුවමනා හමුවේ ඒවා සපුරා ගැනීමට ඇති සම්පත් (කාලය, මුදල්, ශ්‍රමය, ඉඩම් වැනි දෑ) සීමිත ව පවතින තත්ත්වයකි. හිඟකම නිසා පුද්ගලයන්ට, සමාගම්වලට සහ රජයන්ට තමන් ආශා කරන සියල්ල නිෂ්පාදනය කිරීමට

හෝ පරිභෝජනය කිරීමට නොහැකි ය. එබැවින් මිනිසුනට තේරීම් කිරීමට සිදු වේ.

(ලකුණු 01යි)

- තේරීමක් කරන සෑම විට ම අත්හළ ඊළඟ හොඳම විකල්පය ආවස්ථික පිරිවැය ලෙස හැඳින්වේ. වෙනත් වචනවලින් කිවහොත් ආවස්ථික පිරිවැය යනු තීරණයක් ගන්නා විට ඒ සඳහා කැපකරන හොඳම විකල්පයේ වටිනාකම ය. (ලකුණු 01යි)

- පුද්ගලයන්ගේ ආවස්ථික පිරිවැය : පුද්ගලයන්ට ආදායම් හා කාලය පිළිබඳ හිඟයන්ට මුහුණදීමට සිදු වේ. එබැවින් ඔවුන් විකල්ප අතර තෝරා ගත යුතු වේ.

- නිදසුන් : කිසියම් සිසුවෙකු ආර්ථික විද්‍යාව පාඩමක් හැදෑරීමට පැයක් ගත කරන්නේ නම් එම කටයුත්තෙහි ආවස්ථික පිරිවැය පැයක විවේකයක් හෝ විනෝදාස්වාදයක් හෝ අහිමි වී යාමක් විය හැකි ය.

- පුද්ගලයෙක් ස්මාර්ට් දුරකතනයක් මිල දී ගැනීමට රු. 50,000ක් වැය කරන්නේ නම්, එම ක්‍රියාවේ ආවස්ථික පිරිවැය වනුයේ කෙටි නිවාඩුවක් ගත කිරීමට තිබූ අවස්ථාවක් අහිමි වී යාමක් හෝ වැඩි දුර අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා ඉතිරි කිරීමට අදහස් කර තිබූ මුදල් ප්‍රමාණයක් අහිමිවීමක් විය හැකි ය.

(ඕනෑම සමාන උදාහරණයකට ලකුණු 01යි)

- රජයන් සඳහා ආවස්ථික පිරිවැය : රජයන් ද මූල්‍ය හා මූර්ත සම්පත් හිඟයන්ට මුහුණ දෙන බැවින් වියදම් කිරීමේ දී ප්‍රමුඛතා මත වියදම් සැලසුම් කිරීමට සිදු වේ.

- නිදසුන් : අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා රජය වැඩි මුදලක් වැය කිරීමට තීරණය කරන්නේ නම් එහි ආවස්ථික පිරිවැය සෞඛ්‍ය සේවා හෝ අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන අඩු කිරීමක් විය හැකි ය.

- රජය ක්‍රිකට් ක්‍රීඩා පිටියක් ඉදිකිරීමට ඉඩමක් භාවිතයට ගත් විට කර්මාන්තශාලාවක් ඉදිකිරීමට තිබූ අවස්ථාව අහිමි වී යාමට පිළිවන. එම ක්‍රියාවේ ආවස්ථික පිරිවැය වනුයේ අහිමි වී ගිය කාර්මික නිමැවුම ය.

(ඕනෑම සමාන උදාහරණයකට ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(iii) - විශේෂ ප්‍රාගුණ්‍යය : සේවකයන් නිශ්චිත කාර්යයක් නැවත නැවතත් ඉටු කරන අතර එම කාර්යයෙහි ඔවුහු ඉතා ඉහළ කුසලතා හිමිකර ගනිමින් කාර්යක්ෂම වෙති. මෙය කාලය හා වැරදි අඩු වීමට බලපාන අතර ප්‍රතිශීර්ෂ නිමැවුම හෙවත් ඵලදායිතාව ඉහළ නගී.

- කාලය ඉතිරි කරයි : සේවකයන්ට විවිධ කාර්යයන් අතර මාරුවීමට අවශ්‍ය නොවන බැවින් කාලය ඉතිරි වේ. එක් ක්‍රියාවලියකින් තවත් ක්‍රියාවලියකට මාරු වීමට හෝ මෙවලම් නිතර වෙනස් කිරීමට කාලය නාස්ති නොවේ.

- යන්ත්‍රෝපකරණ භාවිතය : ශ්‍රමික විභාජනය නිෂ්පාදන ක්‍රියාවලියේ දී යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම සහ භාවිත කිරීම පහසු කරයි. ඒ ඒ ක්‍රියාවලින්ට විශේෂිත යන්ත්‍ර නිෂ්පාදනයේ වේගය සහ නිමැවුම් පරිමාව වැඩි කරයි.



CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ඉහළ නිමැවුම සහ අඩු පිරිවැය : විශේෂ ප්‍රාගුණ්‍යතාය සහිත සේවකයන් සහ විශේෂිත යන්ත්‍ර නිසා ඒක පුද්ගල නිමැවුම වැඩි ය. ඵලදායිතාව ඉහළ යන බැවින් නිෂ්පාදනයේ සාමාන්‍ය පිරිවැය අඩු ය.

- නවෝත්පාදනයන් : එක් කාර්යයක් නැවත නැවත කරන බැවින් සේවකයන්ට නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා නවෝත්පාදන යෝජනා කිරීමට ඉඩ සළසයි. එමගින් සමස්ත ඵලදායිතාව තවදුරටත් ඉහළ නංවා ගත හැකි වේ. (3)

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනකට ලකුණු 03යි)

(කෙටි විස්තරයන් නොමැති ව කරුණු 3ක් පමණක් සඳහන් කර ඇත්නම් උපරිම ලකුණු 01ක් ලබා දිය යුතු ය.)

ප්‍රමිතිකරණය — ප්‍රමිතිකරණය මගින් නිෂ්පාදනයේ ඒකාකාරී ගුණය නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක ඉහළ නගියි. ඒ අනුව ඵලදායිතාව ඉහළ යයි.

(iv) - ආර්ථික නිදහස :

- වෙළෙඳපොළ ආර්ථිකයක පුද්ගලයන්ට සහ පෞද්ගලික සමාගම්වලට ආර්ථික තීරණ ගැනීමට ඉතා ඉහළ මට්ටමක නිදහසක් පවතී. එහෙත් විධාන ආර්ථිකයක කුමක් නිෂ්පාදනය කළ යුතු ද? කවර ස්ථානයක වැඩ කළ යුතු ද? ආයෝජනය කළ යුත්තේ කෙසේ ද යන කරුණු පිළිබඳ තෝරා ගැනීම් කිරීමේ දී පුද්ගලයන්ට හා සමාගම්වලට ඇත්තේ ඉතා සුළු නිදහසකි. නැතහොත් නිදහසක් ඇත්තේ ම නැත.

- වෙළෙඳපොළ ආර්ථිකයක පුද්ගලයන්ට වෘත්තීන් තෝරා ගැනීමට, ව්‍යාපාර ආරම්භ කිරීමට, තමන් කැමැති තැනක ආයෝජනය කිරීමට නිදහස ඇත. එහෙත් විධානගත ආර්ථිකයක, ආර්ථික තීරණ ප්‍රධාන වශයෙන් ගනු ලබන්නේ මධ්‍යම රජය විසිනි.

- වෙළෙඳපොළ ආර්ථිකයක මිලකරණය සම්බන්ධයෙන් ආණ්ඩුවේ මැදිහත්වීම ඉතා අවම මට්ටමක පවතී. එහෙත් විධානගත ආර්ථිකය මිල ගණන්, නිෂ්පාදන ඉලක්ක සහ සම්පත් බෙදාවෙන්කිරීම රජය විසින් තීරණය කරනු ලැබේ.

(එක් වෙනස්කමකට ලකුණු 01 බැගින් ඕනෑම වෙනස්කම් දෙකකට ලකුණු 02යි)

- පාරිභෝගික ස්වාධිපත්‍යය
  - වෙළෙඳපොළ ආර්ථිකයක පාරිභෝගිකයන්ට පූර්ණ ස්වාධිපත්‍යයක් ඇත. නිෂ්පාදකයන් භාණ්ඩ හා සේවා නිපදවන්නේ පාරිභෝගික ඉල්ලුමට ප්‍රතිචාර දක්වමිනි. විධානගත ආර්ථිකයක පාරිභෝගික ස්වාධිපත්‍යය ඉතා දුර්වල ය. නැතහොත් ඇත්තේ ම නැත.

  - වෙළෙඳපොළ ආර්ථිකයක පාරිභෝගිකයන් විසින් වැඩි වැඩියෙන් ඉල්ලුම් කරනු ලබන භාණ්ඩ හා සේවා වැඩි වැඩියෙන් නිපදවනු ලැබේ. විධානගත ආර්ථිකයක පාරිභෝගිකයන්ට ලැබෙන්නේ රජය විසින් ලබා දෙන දේවල් ය. හිඟයන් සහ අතිරික්තයන් නිතර නිතර දක්නට ලැබේ. (4)

  - වෙළෙඳපොළ ආර්ථිකයක සම්පත් බෙදා වෙන් කිරීමෙහි ලා මග පෙන්වනුයේ පාරිභෝගික තේරීම ය. එහෙත් විධානගත ආර්ථිකයක නිෂ්පාදනය පදනම් වී ඇත්තේ පාරිභෝගික අභිරුචිය මත නොව රජයේ සැලසුම්කරණය මත ය.

(ඕනෑම එක් වෙනස්කමකට ලකුණු 01 බැගින් වෙනස්කම් දෙකකට ලකුණු 02)

(මුළු ලකුණු 04යි)

* වෙනස්කම් වෙනත් ආකාරයට ඉදිරිපත් කරන විට උපරිම ලකුණු දෙන්න. (ආර්ථික නිදහස, පාරිභෝගික ස්වාධිපත්‍යය)

(v) - සෑම ආර්ථිකයක් ම මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න වන්නේ කුමක් නිෂ්පාදනය කළ යුතු ද? කෙසේ නිෂ්පාදනය කළ යුතු ද? සහ කා සඳහා නිෂ්පාදනය කළ යුතු ද? යන ප්‍රශ්න වේ.

- කුමක් නිෂ්පාදනය කළ යුතු ද? (සඵලතාව)
  - පාරිභෝගිකයන් ඉල්ලුම් කරන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා මිල යාන්ත්‍රණය සම්පත් බෙදා වෙන් කර දේ. නිෂ්පාදකයෝ මිල සංඥාවලට ප්‍රතිචාර දක්වති. ඉහළ මිල මඟින් ඉහළ ඉල්ලුමක් සහ ලාභදායකත්වයක් ඇති බව පෙන්නුම් කරයි.

(ලකුණු 01යි)

- කුමක් නිෂ්පාදනය කළ යුතු ද? (අසමත්වීම)
  - අත්‍යවශ්‍ය භාණ්ඩ (වීදි ලාම්පු වැනි පොදු භාණ්ඩ සහ අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා වැනි සුභසාධන භාණ්ඩ) නොසලකා හැරිය හැක. මන්ද ඒවා ලාභ දායක නොවන බැවින් ය.
  - එසේ ම ඉහළ ඉල්ලුමක් පැවතීම නිසා අවගුණ භාණ්ඩ (මත්පැන්, දුම්වැටි) අධික ලෙස නිෂ්පාදනය වේ. (ලකුණු 01යි)

- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද? (සඵලතාව) :
  - නිෂ්පාදන ආයතන ලාභ උපරිම කර ගැනීම සඳහා හැකිතාක් අඩු පිරිවැයකින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කරයි. එහි ප්‍රතිඵල වශයෙන් කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රම ශිල්ප තෝරා ගැනීමටත් නවෝත්පාදන හා උසස් තාක්ෂණය කරා යොමුවීමටත් මග පෙන්වයි.

(ලකුණු 01යි)

- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද? (අසමත්වීම) :
  - නිෂ්පාදන ආයතන ශ්‍රම සූක්ෂ්ම ක්‍රම වෙනුවට ප්‍රාග්ධන-සූක්ෂ්ම ක්‍රම තෝරා ගන්නේ නම් විරැකියාවට එය හේතු විය හැකි ය.
  - නිෂ්පාදන ආයතන ලාභය ලුහු බැඳ යාමේ දී බාහිර පිරිවැය (ඍණ බාහිරතා) නොසළකා හරින බැවින් පාරිසරික හායනය ඇති විය හැකි ය.

(ලකුණු 01යි)

- කා සඳහා නිෂ්පාදනය කළ යුතු ද? (සඵලතාව)
  - වෙළෙඳපොළ ආර්ථිකයක නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සමාජය තුළ බෙදී යන්නේ ක්‍රය ශක්තිය පදනම් කර ගෙන ය. එනම් භාණ්ඩ මිල දී ගැනීමට හැකියාව ඇති අය වෙතට ය. එබැවින් මිල දී ගැනීමට නොහැකි හෝ මිල දී ගැනීමට අකමැති භාණ්ඩ නිපදවීම සඳහා සම්පත් නාස්තියක් සිදු නොවේ.

(ලකුණු 01යි)

- කා සඳහා නිෂ්පාදනය කළ යුතු ද? (අසමත්වීම)
  - දුප්පතුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලිය නොහැකි ය. මන්ද ඔවුන්ට මිල දී ගැනීමේ හැකියාවක් හෙවත් ක්‍රය ශක්තියක් නොමැති බැවින් ය.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 05යි)

(සඵලතාවන් හෝ සීමාකම් හෝ පමණක් සඳහන් කොට ඇති පිළිතුරුවලට උපරිම වශයෙන් ලකුණු 03ක් පමණි.)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**02 වන ප්‍රශ්නය**

2. (i) සැපයුම් වක්‍රය විතැන් වීමකට හේතු විය හැකි සාධක තුනක් ලැයිස්තු ගත කරන්න. (ලකුණු 03යි)

(ii) ඉල්ලුමේ මිල නම්‍යතාව යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? එය මුළු අයභාරයට බලපානුයේ කෙසේ දැ'යි පහදන්න. (ලකුණු 04යි)

(iii) යෝග්‍ය රූපසටහන් භාවිත කරමින් ආදායමේ වෙනස් වීමක් සාමාන්‍ය හා බාල භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) නිෂ්පාදක අතිරික්තය නිර්වචනය කර සැපයුම හා ඉල්ලුම සහිත රූපසටහනක එය නිරූපණය කරන ආකාරය පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

(v) නිෂ්පාදන තාක්ෂණයේ වැඩි දියුණුවීමක් වෙළෙඳපොළ සමතුලිතතාවයේ වෙනස්කම් හටගැනීමට හේතු විය හැක්කේ කෙසේ ද? ඔබේ පිළිතුර සඳහා රූපසටහන් ආධාර කර ගන්න. (ලකුණු 05යි)

02. (i) සැපයුම් වක්‍රය විතැන්වීමට බලපාන සාධක :

- නිෂ්පාදන පිරිවැය (සාධක මිල ගණන්)
- තාක්ෂණය
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති (බදු හා සහනාධාර)
- වෙළෙඳපොළේ සිටින සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව
- අනාගත මිල පිළිබඳ අපේක්ෂාවන් / අනාගත වෙළඳපොළ පිළිබඳ අපේක්ෂාවන්
- ස්වාභාවික සාධක (කෘෂිකාර්මික නිෂ්පාදනයට බලපාන කාලගුණික සාධක)

(එක් සාධකයකට ලකුණු 01 බැගින් සාධක තුනක් සඳහා ලකුණු 03යි)

- සම්බන්ධිත භාණ්ඩ වල මිල

(ii) - ඉල්ලුම් මිල නම්‍යතාව යනුවෙන් අදහස් කරනුයේ අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට, කිසියම් භාණ්ඩයක හෝ සේවාවක ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය එම භාණ්ඩයේ හෝ සේවාවේ මිල වෙනස්වීම කෙරෙහි දක්වන ප්‍රතිචාරයයි.

(ලකුණු 01යි)

- මිල නම්‍යතාව මුළු අයභාරයට බලපාන ආකාරය :


ඉල්ලුම් මිල නම්‍යතාව සහ මුළු අයභාරය අතර ඇති සම්බන්ධතාව පහත වගුවේ දැක්වේ.


| නම්‍යතාවේ ස්වරූපය | නම්‍යතාවේ අගය | මිල වෙනස් වීම | මුළු අයභාරය |
|---|---|---|---|
| නම්‍ය වේ | > 1 | වැඩි වේ | අඩු වේ |
| | | අඩු වේ | වැඩි වේ |
| අනම්‍ය වේ | < 1 | වැඩි වේ | වැඩි වේ |
| | | අඩු වේ | අඩු වේ |
| ඒකීය නම්‍ය වේ | = 1 | වැඩි වේ | වෙනස් නොවේ |
| | | අඩු වේ | වෙනස් නොවේ |
| පූර්ණ නම්‍ය | ∞ | වැඩි වේ | ශුන්‍ය දක්වා අඩු වේ |
| | | අඩු වේ | ඉතා විශාල ලෙස වැඩි වේ |
| පූර්ණ අනම්‍ය | 0 | වැඩි වේ | වැඩි වේ |
| | | අඩු වේ | අඩු වේ |

(ඕනෑම සම්බන්ධතාවකට ලකුණු 01 බැගින් සම්බන්ධතා තුනකට ලකුණු 03යි)

(මුළු ලකුණු 04යි)

(iii) - ආදායම් වෙනස් වීමක් සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුමට බලපාන ආකාරය :
සාමාන්‍ය භාණ්ඩ යනුවෙන් අදහස් කරන්නේ ආදායම සහ ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින භාණ්ඩ ය. පාරිභෝගිකයන්ගේ ආදායම වැඩිවන විට සාමාන්‍ය භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. ආදායම අඩු වන විට ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.









ආදායම වෙනස්වීමට පෙර ඉල්ලුම් වක්‍රය $D_1$ වන අතර ආදායම වෙනස් වූ පසු ඉල්ලුම් වක්‍රය $D_2$ වේ.

4

- බාල භාණ්ඩ යනු ආදායම හා ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් ඇති භාණ්ඩයකි. එබැවින් පාරිභෝගික ආදායම වැඩි වන විට බාල භාණ්ඩයන් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ. ආදායම අඩු වන විට ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.

පහත රූපසටහනෙහි මෙය දක්වේ.




(එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් අවස්ථා හතරට ලකුණු 04යි)

(iv) - නිෂ්පාදක අතිරික්තය යනු නිෂ්පාදකයෙකුට භාණ්ඩයක් සඳහා සැබැවින් ම ලැබෙන වෙළෙඳපොළ මිල සහ ඔවුන් එය අලෙවිකිරීමට කැමැති අවම මිල (නිෂ්පාදනයේ ආන්තික පිරිවැය) අතර වෙනස ය. එම මිල වෙනස අලෙවි කරන සෑම ඒකකයක් නිසාම එකතු කර ගන්නා ලාභය වේ. (සමුච්චිත අගයයි)


- එය නිෂ්පාදකයන් පිළිගැනීමට කැමැති අවම මිලට වඩා වැඩි වෙළෙඳපොළ මිලකට විකිණීමෙන් ලබා ගන්නා අමතර ප්‍රතිලාභය හෝ ලාභය නියෝජනය කරයි.

(ලකුණු 02යි)

- සැපයුම්-ඉල්ලුම් රූපසටහනක එය දක්වන ආකාරය පහත දක් වේ.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner





(නිවැරදි රූපසටහනට ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)

(v) - නිෂ්පාදන තාක්ෂණයේ දියුණුව සැපයුම වැඩි කිරීමට හේතුවන අතර එමගින් වෙළෙඳපොළ මිල පහළ බසින අතර වෙළෙඳපොළ නිෂ්පාදනය ඉහළ යයි.

- උසස් තාක්ෂණය නිෂ්පාදන පිරිවැය අඩු කරයි.
- නිෂ්පාදකයෝ එක් එක් මිල යටතේ පෙරට වඩා වැඩියෙන් සැපයීමට කැමැත්තෙන් සිටිති.
- සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
- මෙම තත්ත්වය පැරණි මිල යටතේ වෙළෙඳපොළෙහි අධි සැපයුමක් බිහිවීමට තුඩු දෙන අතර මිල පහළ වැටීමට හේතු වේ. අඩු මිලට වැඩි ප්‍රමාණයක් ගනුදෙනු වෙමින් නව වෙළෙඳපොළ සමතුලිතයක් ස්ථාපිත වේ.

(ලකුණු 03යි)




(නිවැරදි රූපසටහනට ලකුණු 02යි)

(මුළු ලකුණු 05යි)

මිල පහල වැටීම නිසා ඇති ඉල්ලුම හා සැපයුම් මුදල ප්‍රමාණය වැඩි වෙනවා.

**03 වන ප්‍රශ්නය**

3. (i) අවම මිලක් යනු කුමක් ද? තරගකාරී ශ්‍රම වෙළෙඳපොළක් තුළ සමතුලිත වැටුපට වඩා ඉහළින් අවම වැටුපක් පැනවීමෙන් හැඟවෙන දෑ රූපසටහනක් යොදා ගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

(ii) කෘෂිකාර්මික භාණ්ඩ මිල ස්ථායිකරණය සඳහා රජයේ ස්වාරක්ෂක තොග පවත්වා ගෙන යාමේ සංකල්පය අගයන්න. එවැනි යෝජනා ක්‍රම අසාර්ථක වීමට හේතු විය හැකි සාධක මොනවා ද? (ලකුණු 04යි)

(iii) කෘෂිකාර්මික භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම ($Q_D$) සහ සැපයුම ($Q_S$) ශ්‍රිත පහත සමීකරණ මගින් ලබා දී ඇත. මෙම සමීකරණවල P යනු කිලෝග්‍රෑමයක මිල රුපියල්වලින් ද Q යනු ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් ද වේ.

$Q_D = 720 - 4P$          $Q_S = -180 + 6P$

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02යි)


(ආ) ගොවීන්ට කිලෝග්‍රෑමයකට රු. 100ක් ලැබෙන බවට සහතිකයක් සහිත ව රජය දැන් ඌනපූර්ණ ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දෙතැයි සිතමු. එම මිල ආධාරක වැඩ සටහනින් පසුව මෙම භාණ්ඩය වෙළෙඳපොළ තුළ අලෙවි වන මිල ගණනය කරන්න. (ලකුණු 03යි)

(ඇ) මිල ආධාරක වැඩසටහන සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය ඇස්තමේන්තු කරන්න. (ලකුණු 03යි)

(ඈ) මිල ආධාරක වැඩසටහනට පෙර හා පසු නිෂ්පාදක අතිරික්තය සසඳන්න. (ලකුණු 04යි)

03. (i) - අවම මිලක් (a price floor) යනුවෙන් අදහස් කරනුයේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා අය කළ හැකි නීත්‍යානුකූලව ස්ථාපිත අවම මිලකි. එවිට ප්‍රකාශිත අවම මිලට වඩා අඩු මිලකට එම භාණ්ඩය හෝ සේවාව හුවමාරු කර ගැනීම නීතියට පටහැනි වේ. සැපයුම්කරුවන්ට අවම ආදායමක් ලැබෙන බව සහතික කරනු පිණිස අවම මිල සකසනුයේ වෙළෙඳපොළ සමතුලිත මිලට වඩා ඉහළිනි.

(ලකුණු 01යි)




(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01යි)

- අවම වැටුප ප්‍රකාශයට පත් කිරීමට පෙර ශ්‍රම වෙළෙඳපොළ වැටුප $W_1$ වූ අතර එම වැටුප් මට්ටම යටතේ සමතුලිතයක් පැවැතිණි. එහිදී ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම සමාන විය. සමතුලිත වැටුපට ඉහළින් අවම වැටුප නියම කිරීම නිසා වෙළෙඳපොළෙහි ශ්‍රම සැපයුම ශ්‍රම ඉල්ලුම ඉක්මවා ගොස් සැපයුම් අතිරික්තයක් හටගනී. ඉන් අදහස් වන්නේ ශ්‍රම වෙළෙඳපොළේ විරැකියා තත්ත්වයන් පැන නැගීම ය.

- අතික් අතට අවම වැටුප තරගකාරී වැටුපට වඩා ඉහළ එකක් වීම නිසා සේවා නියුක්ත පිරිසට ලැබෙන ආදායම ඉහළ ගොස් ඇත. නමුත් ඉහළ වැටුප් මට්ටම නිසා වැඩිපුර සේවකයන් බඳවා ගැනීමට සේවා යෝජකයෝ මැළි වෙති.

(අවම වැටුප් ප්‍රතිඵල දැක්වීමට ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)



CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) - ස්වාරක්ෂක තොග යෝජනා ක්‍රමයක් යනු සැපයුම ඉහළ මට්ටමක පවතින විට අතිරික්ත නිෂ්පාදිතය මිල දී ගැනීමෙන් සහ සැපයුම අඩු වූ විට තොග මුදා හැරීමෙන් කෘෂි කාර්මික භාණ්ඩයක මිල ස්ථාවර කිරීම සඳහා නිර්මාණය කර ඇති රජයේ ප්‍රතිපත්තියකි. මිල අස්ථාවරත්වය අඩු කිරීම සහ නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් දෙපිරිසම දැඩි උච්චාවචන යන්ගෙන් රැක ගැනීම සහතික කිරීම මෙහි අරමුණ වේ. (ලකුණු 01යි)

- වාසි :
  - මිල ස්ථායිකරණය : ගොවීන්ගේ ආදායම් ආරක්ෂා කරමින් අස්වැන්න නෙළන කාලවල දී මිල ගණන්වල දැඩි පහත වැටීම වළක්වයි.
  - හිඟයන් ඇති අවස්ථාවල දී මිල ඉහළ යාම වැළැක්වීමට උපකාර වෙමින් පාරිභෝගිකයන් ආරක්ෂා කරයි.
  - නිෂ්පාදනය දිරිමත් කරයි : අවම මිල පිළිබඳ සහතිකයක් ඇති බැවින් නිෂ්පාදනය වැඩි කිරීමට ගොවියෝ උනන්දු වෙති.
  - ආහාර සුරක්ෂිතතාව : ස්වාරක්ෂක තොග පවත්වා ගැනීමෙන් හිඟ කාලවල දී අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සහතික කළ හැකි ය.
  - වෙළෙඳපොළ විශ්වාසය : වෙළෙඳපොළවල අවිනිශ්චිතතාව සහ සමපේක්ෂණ හැසිරීම් අඩු කරයි.

(ඕනෑම එක් වාසියකට ලකුණු 01යි)

- අවාසි :
  - රජයට අධික පිරිවැයක් දැරීමට සිදු වේ : අතිරික්තය මිල දී ගැනීමට, ගබඩා පහසුකම් ඇති කිරීමට, තොග නඩත්තු කිරීමට, මූල්‍ය සම්පත් අවශ්‍ය වේ.
  - නරක්වීමේ අවදානම : නශ්‍ය භාණ්ඩ විනාශයට පත් විය හැකි ය. සම්පත් නාස්තියක් සිදු වේ.
  - වෙළෙඳපොළ සංඥා විකෘති කෙරේ : කෘත්‍රිම ව මිල ස්ථාවර කිරීම නිසා ගොවීන්ට වෙළෙඳපොළ ඉල්ලුමට අනුව නිෂ්පාදනය සැලසුම් කිරීමට ඇති දිරිගැන්වීම් අඩු වේ.
  - ප්‍රශස්ත තොග මට්ටම් තීරණය කිරීමේ අපහසුතාව : ඕනෑවට වඩා තොග රැස් කිරීම පිරිවැය ඉහළ යාමට හේතු වේ. ප්‍රමාණවත් තොග තබා නොගැනීමෙන් මිල ස්ථාවර කර ගැනීම අපහසු වේ.
  - උද්ධමන අවදානම : ඉහළ මිලකට තොග නිකුත් කිරීම හෝ ඉහළ මිලකට අතිරික්ත තොග මිල දී ගැනීම පොදු මිල මට්ටම ඉහළ යාමට බලපෑ හැකි ය.

(ඕනෑම එක් අවාසියකට ලකුණු 01යි)

- අසාර්ථකත්වයට බලපා හැකි කරුණු :
  - නිෂ්පාදනය ඕනෑවට වඩා උච්ඡාවචනය වුවහොත් (දැඩි නියඟය, ගංවතුර වැනි උපද්‍රව නිසා) ස්වාරක්ෂක තොග, මිල ස්ථායිතාව ඇති කිරීමට ප්‍රමාණවත් නොවිය හැකි ය.
  - ඉහළ ගබඩා පිරිවැය, නශ්‍ය භාණ්ඩ, ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති වීම වැනි කරුණු නිසා මෙම වැඩ පිළිවෙළ ආර්ථික වශයෙන් තිරසාර නොවිය හැකි ය.
  - ඉල්ලුම හා සැපයුම නිවැරදි ව පුරෝකථනය නොකිරීම නිසා වුවමනාවට වැඩියෙන් හෝ වුවමනාවට වඩා අඩුවෙන් හෝ ගබඩා විය හැකි ය.
  - රජයන් වෙළෙඳපොළ ස්ථාවරත්වයට වඩා දේශපාලන වාසි සඳහා මිල දී ගැනීම් හසුරුවා ගත හැකි ය.

(ඕනෑම එක් අසාර්ථකත්වයකට ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(iii) (අ) සමතුලිත මිල හා ප්‍රමාණය :

- $Q_D = Q_S$
- $720-4P=-180+6P$
- $900=10P; \quad P = 90$
- සමතුලිත මිල, කිලෝග්‍රෑමයක් රු. 90කි. (ලකුණු 01යි)
- $Q_D=720-4(90)$
- $Q_D= 720 - 360 = 360$
- සමතුලිත ප්‍රමාණය, මෙට්‍රික් ටොන් 360කි. (ලකුණු 01යි)

(ආ) උපන පූර්ණ ගෙවීම් ක්‍රමය හඳුන්වා දුන් පසු නව වෙළෙඳපොළ මිල :

- $Qs=-180+6(100)=$ ටොන් 420
- $Q_D=Q_S=420$ (ලකුණු 01යි)
- $720-4P=420; \quad 4P = 300$
- $P = 75$
- නව වෙළෙඳපොළ මිල : කි.ග්‍රෑමයක් රු. 75කි. (ලකුණු 02යි)

(ඉ) රජයට දැරීමට සිදුවන පිරිවැය :

- සහතික මිල සහ වෙළෙඳපොළ මිල අතර වෙනස = 100 - 75 = 25
  කි.ග්‍රෑමයකට රු. 25 (ලකුණු 01යි)
- වෙළෙඳපොළේ අලෙවි වන මුළු ප්‍රමාණය = ටොන් 420
  = කි.ග්‍රෑම් 420
- මුළු පිරිවැය = 420 x 25 = 10.5 රු.මිලියන 10.5 (ලකුණු 02යි)

(ඊ) වැඩසටහනට පෙර නිෂ්පාදක අතිරික්තය :

- නිෂ්පාදකයාට ලැබුණු මිල = කි.ග්‍රෑමයකට රු. 90
- අලෙවි කළ ප්‍රමාණය = ටොන් 360
- නිෂ්පාදකයා සැපයීමට කැමැති අවම මිල = කි.ග්‍රෑමයකට රු. 30
- නිෂ්පාදක අතිරික්තය = 1/2 (90 - 30) x 420 x 1000
- 1/2 (60 x 360) x 1000 = රු. 10,800,000
- නිෂ්පාදක අතිරික්තය රු.මිලියන 10.8 (ලකුණු 01යි)

- වැඩසටහනට පසු නිෂ්පාදක අතිරික්තය :
- නිෂ්පාදකයාට ලැබුණු මිල = කි.ග්‍රෑමයකට රු. 100
- අලෙවි කළ ප්‍රමාණය = ටොන් 420
- නිෂ්පාදකයා සැපයීමට කැමැති අවම මිල = කි.ග්‍රෑමයකට රු. 30
- නිෂ්පාදක අතිරික්තය = 1/2 (100 - 30) x 420 x 1000
- 1/2 (70 x 420) x 1000 = රු. 14,700,000 රු.මිලියන 14.7 (ලකුණු 01යි)
- නිෂ්පාදක අතිරික්තය රු.මිලියන 10.8 සිට රු.මිලියන 14.7ක් දක්වා රු.මිලියන 3.9කින් වැඩි වේ.
  (වෙනස දැක්වීමට ලකුණු 02යි)
  (මුළු ලකුණු 12යි)



CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


**04 වන ප්‍රශ්නය**

4. (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය නිර්වචනය කර, එය දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ii) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය මගින් ආයතනයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) සහ ආන්තික පිරිවැය (MC) වක්‍රවල හැඩය හා හැසිරීම පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(iii) ආයතනයේ පිරිවැය ව්‍යුහයේ කොටසක් ලෙස ප්‍රාමාණික ලාභය ඇතුළත් කිරීම තබ සාධාරණීයකරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(iv) පහත රූපසටහන පූර්ණ තරගකාරී ආයතනයක කෙටි කාලීන පිරිවැය ව්‍යුහය සහ පැවතිය හැකි වෙළෙඳපොළ මිල ගණන් පෙන්වයි.




(i) වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයකට රු. 45ක් නම්,

(අ) ආර්ථික ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02යි)

(v) ඒකාධිකාරී තරගය නිර්වචනය කර, එය පූර්ණ තරගයෙන් හා ඒකාධිකාරයෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

04. (i) - කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය පෙන්නුම් කරනුයේ අවම වශයෙන් එක් යෙදවුමක් හෝ ස්ථාවර ව (ප්‍රාග්ධනය හෝ භූමිය) තබා ගනිමින් විචල්‍ය යෙදවුම් පමණක් වෙනස් කරන විට විචල්‍ය යෙදවුම් හා නිමැවුම් ප්‍රමාණය අතර ඇති සම්බන්ධතාවයි.

(ලකුණු 01යි)

- දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් වෙනස් වන ආකාරය :
  - කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය අවම වශයෙන් එක් යෙදවුමක් හෝ ස්ථාවර වූ විට විචල්‍ය යෙදවුම් හා නිමැවුම් අතර සම්බන්ධතාව පෙන්වයි. දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය මගින් සියලු ම යෙදවුම් විචල්‍ය වූ විට යෙදවුම් හා නිමැවුම් අතර සම්බන්ධතාව පෙන්වයි.
  - කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයේ දී නිෂ්පාදන ආයතනවලට නිෂ්පාදනයේ සියලු ම සාධක වෙනස් කළ නොහැකි ය. දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයේ දී ආයතනවලට කර්මාන්තශාලාවේ ධාරිතාව සහ තාක්ෂණය ඇතුළු නිෂ්පාදන සාධක සියල්ල වෙනස් කළ හැකි ය.
  - කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය හීනවන ආන්තික ඵලදා නීතියට යටත් වේ. දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය පරිමාණානුකූලඵල (වැඩි වන, අඩු වන, ස්තාවර ඵල) නීතියට යටත් වේ.

(එක් වෙනස්කමකට හා පැහැදිලි කිරීමකට ලකුණු 01 බැගින්
ඕනෑම වෙනස්කම් දෙකකට ලකුණු 02යි)
(මුළු ලකුණු 03යි)

(ii) - නිෂ්පාදන ආයතනයක පිරිවැය වක්‍රවල විශේෂයෙන් සාමාන්‍ය විචල්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය වක්‍රය හැඩය සහ හැසිරීම, කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය සෘජුව ම තීරණය කරයි. මෙම සම්බන්ධතාව ඇති වන්නේ නිෂ්පාදනය සහ පිරිවැය එක ම ක්‍රියාවලියක දෙපැත්ත වන බැවිනි. යෙදවුම් මගින් නිමැවුම් ජනනය කරන ආකාරය නිෂ්පාදනය පෙන්නුම් කරයි. අනික් අතට පිරිවැය පෙන්නුම් කරන්නේ එම යෙදවුම් සඳහා දරන්නට සිදු වන වියදම්යි.

(ලකුණු 01යි)

- ආන්තික පිරිවැය (MC) වක්‍රයේ හැඩය ආන්තික නිෂ්පාදිත වක්‍රයේ හැඩයේ දර්පණයයි. ආන්තික පිරිවැය විචල්‍ය යෙදවුමේ ආන්තික නිෂ්පාදිතය මත රඳා පවතී. ආන්තික නිෂ්පාදිතය ඉහළ මට්ටමක පවතින විට ආන්තික පිරිවැය අඩු වේ. හීනවන ඵලදාව නිසා ආන්තික නිෂ්පාදිතය අඩු වන විට ආන්තික පිරිවැය ඉහළ යයි. එක් එක් අතිරේක සේවකයා ක්‍රමයෙන් අඩු වන ඵලදාවක් ජනනය කරන්නේ නම් අතිරේක නිමැවුම් ඒකක නිෂ්පාදනය කිරීමේ පිරිවැය ද වැඩි වේ. එබැවින් ආන්තික පිරිවැය වැඩි වේ. (ලකුණු 01යි)

- සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) යනු එක් නිමැවුම් ඒකකයකට වැය වන විචල්‍ය පිරිවැය ප්‍රමාණයයි. AVC වක්‍රය U - හැඩයක් ගනී. මන්දයත් මුල දී විචල්‍ය යෙදවුම් (ශ්‍රමය) වැඩි කරන විට නිමැවුම ද වේගයෙන් ඉහළ යන අතර වැඩි නිමැවුම් ප්‍රමාණයක් මත පිරිවැය පැතිරෙන බැවින් AVC පහළ වැටේ. එහෙත් හීනවන ඵල හේතු කොට ගෙන ප්‍රතිශ්‍රමික නිමැවුම් අඩු වන බැවින් සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) ඉහළ යයි. (ලකුණු 01යි)

- හීනවන ආන්තික ඵලදා නීතිය හේතුවෙන් ආන්තික නිෂ්පාදිතය පළමුව වැඩි වී පසුව අඩු වී එහි ප්‍රතිඵලයක් ලෙස ආන්තික පිරිවැය (MC) පළමුව අඩු වී පසුව වැඩි වේ. U - හැඩය ගනී. සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) ද මුල දී අඩු වී පසුව වැඩි වේ. U - හැඩය ගනී. මේ අනුව කෙටිකාලීන ආන්තික සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍ර වල හැඩය විචල්‍ය යෙදවුම් ආන්තික හා සාමාන්‍ය නිෂ්පාදිතය මගින් සෘජුව ම තීරණය වේ.

(ලකුණු 01යි)

(ප්‍රස්තාර යොදා ගනිමින් පැහැදිලි කරන විට ද සම්පූර්ණ ලකුණු ලබා දිය හැක.)

(මුළු ලකුණු 04යි)

(iii) - ප්‍රාමාණික ලාභය යනු ව්‍යවසායකයෙකුට තම ප්‍රාග්ධනය, කාලය සහ උත්සාහය වැනි සම්පත් වෙනත් තැනක යොදවා වර්තමාන ව්‍යාපාරයේ භාවිත කිරීමට අවශ්‍ය අවම ප්‍රතිලාභයයි. එය ව්‍යවසායකත්වයේ ආවස්ථික පිරිවැයයි. එනම් මෙම සම්පත් වෙනත් තැනක භාවිත කළේ නම් ඔවුනට උපයා ගත හැකි ව තිබූ ප්‍රතිලාභයයි. (ලකුණු 01යි)

- ප්‍රාමාණික ලාභය ආයතනයේ මුළු පිරිවැය ව්‍යුහයට ඇතුළත් කිරීම යුක්ති සහගත වන්නේ පහත සඳහන් හේතු නිසා ය.
  - එය ව්‍යවසායකත්වයේ ආවස්ථික පිරිවැය පිළිබිඹු කරයි.
  - ආයතනය කර්මාන්තයේ රැඳී සිටීමට අවශ්‍යකරන සියලු පිරිවැය ආවරණය කරන බව එය සහතික කරයි.
  - එය ආර්ථික විද්‍යාඥයන්ට ආර්ථික ලාභය තක්සේරු කිරීමටත් දිගුකාලයේ දී නව ආයතන වෙළෙඳපොළට ඇතුලු වේද නැද්ද යන්න තීරණය කිරීමටත් ඉඩ සලසයි.
- • ආර්ථික විද්‍යා ප්‍රවේශයෙන් මුළු පිරිවැය විශ්ලේෂණය කිරීමේ දී එයට සියලු ම ගණ්‍ය පිරිවැය සහ ව්‍යංග (ආරෝපිත) පිරිවැය ඇතුළත් කෙරේ. ප්‍රමාණික ලාභය ව්‍යංග



CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිරිවැයක් ලෙස සලකනු ලබන්නේ ව්‍යවසායකයා තම සම්පත් වෙනත් තැනකට යොමු නොකොට වර්තමාන ව්‍යාපාරය තුළ ආයෝජනය කිරීමෙන් අහිමිවන ආදායම නියෝජනය කරන බැවිනි. එබැවින් එය නිෂ්පාදනයේ පිරිවැයක් ලෙස සලකනු ලැබේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(මුළු ලකුණු 04යි)

(iv)(අ) වෙළෙඳපොළ මිල කි.ග්‍රෑමයක් රු. 45ක් වේ නම් ආයතනයේ ආර්ථික ලාභය හෝ අලාභය

- ලාභය හෝ අලාභය = මුළු අයභාරය (TR) - මුළු පිරිවැය (TC) (ලකුණු 01යි)
- මුළු අයහරය = සමතුලිත නිමැවුම x සමතුලිත ප්‍රමාණය
  = 800 x 45 = 36,000
- මුළු පිරිවැය = සමතුලිත නිමැවුම x සාමාන්‍ය මුළු පිරිවැය (ATC)
  = 800 x 35 = 28,000
- මුළු ආර්ථික ලාභය හෝ අලාභය TR - TC = 36,000 - 28,000
- ආර්ථික ලාභය = රු. 8000 (ලකුණු 01යි)

(මුළු ලකුණු 02යි)

(ආ) - මුළු ස්ථාවර පිරිවැය = සමතුලිත නිමැවුම x සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) (ලකුණු 01යි)

- සාමාන්‍ය ස්ථාවර පිරිවැය = සාමාන්‍ය මුළු පිරිවැය (ATC) - සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)
- = AFC = 35 - 28 = 7
- මුළු ස්ථාවර පිරිවැය = සමතුලිත නිමැවුම (800) x AFC (7) = රු. 5600 (ලකුණු 01යි)

(මුළු ලකුණු 02යි)

(v) - ඒකාධිකාරී තරගය යනු සමාන නමුත් අනන්‍ය නොවන (similar but not identical) නිෂ්පාදිත අලෙවිකරන ආයතන විශාල සංඛ්‍යාවකින් සමන්විත වූ වෙළෙඳපොළ ව්‍යුහයකි. සෑම ආයතනයක් ම සන්නාමකරණය, ගුණාත්මකභාවය, ඇසුරුම්කරණය, ස්ථානගත වීම හෝ පාරිභෝගික සේවය ඔස්සේ තම ප්‍රතිවාදීන්ගෙන් වෙනස් වූ ප්‍රභේදිත නිෂ්පාදිතයක් ඉදිරිපත් කරයි. නිෂ්පාදිතයේ දැකිය හැකි මෙම ප්‍රභේදනය නිසා සෑම ආයතනයකට ම යම් ප්‍රමාණයක වෙළෙඳපොළ බලයක් ඇත. (ලකුණු 02යි)

- ඒකාධිකාරී තරග වෙළෙඳපොළ ව්‍යුහය පූර්ණ තරගයෙන් සහ ඒකාධිකාරයෙන් වෙනස් වන ආකාරය පහත වගුවේ දැක්වේ.

ආයතන වල කැපී පෙනෙන ලක්ෂණ :

| ලක්ෂණය | ඒකාධිකාරී තරගය | පූර්ණ තරගය | ඒකාධිකාරය |
|---|---|---|---|
| ආයතන සංඛ්‍යාව | බොහෝ ය | ඉතා විශාල ය | එක් ආයතනයකි |
| නිෂ්පාදිතයේ ස්වභාවය | ප්‍රභේදිත වේ | සමජාතීය වේ | සුවිශේෂී වේ<br>කිසිදු ආදේශක නැත |
| මිල කෙරෙහි බලපෑම | යම් ප්‍රමාණයකට මිල සකසන්නෙකි | නැත<br>මිල ගනුවෙකි | පූර්ණ පාලනයක් ඇත<br>මිල සකසන්නෙකි |
| ප්‍රවේශයට පවත්නා බාධා | යම් ප්‍රමාණයකට පවතී | කිසිවක් නැත | ඉතා විශාල ය |
| ඉල්ලුම් වක්‍රය | පහළට බෑවුම් වේ | තිරස් රේඛාවකි | පහළට බෑවුම් වේ |
| දිගුකාලයේ දී ලාභ | ප්‍රාමාණික ලාභ පවතී | ප්‍රාමාණික ලාභ පවතී | අති ප්‍රාමාණික ලාභ පවතී |

(ඒකාධිකාරී තරගය පූර්ණ තරගයෙන් හා ඒකාධිකාරයෙන් වෙනස් වන්නේ කෙසේ ද යන්න වගුවේ දක්වා ඇති ලක්ෂණ ඇසුරින් දැක්විය යුතු ය.) (එක් වෙනස්කමක් පැහැදිලි කිරීමට ලකුණු 01 බැගින් ඕනෑම වෙනස්කම් තුනක් පැහැදිලි කිරීමට ලකුණු 03යි)



CamScanner

## 05 වන ප්‍රශ්නය

5. (i) එකතු කළ වටිනාකම් ක්‍රමය භාවිත කරමින්, ජාතික ගිණුම් සැකසීමේ දී රාජ්‍ය සේවයේ නිමැවුමේ වටිනාකම ඇස්තමේන්තු කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04යි)

(ii) කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාළ දත්ත කිහිපයක් පහත වගුවෙහි දක්වා ඇත.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| කෘෂිකර්මය, වන වගාව සහ ධීවර අංශයේ දළ එකතු කළ අගය | 1 500 |
| කර්මාන්ත අංශයේ දළ එකතු කළ අගය | 4 500 |
| සේවා අංශයේ දළ එකතු කළ අගය | 9 500 |
| පෞද්ගලික පරිභෝජන වියදම | 12 000 |
| රජයේ පරිභෝජන වියදම | 1 500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 4 500 |
| භාණ්ඩ හා සේවා අපනයන | 2 000 |
| භාණ්ඩ හා සේවා ආනයන | 3 000 |
| නිෂ්පාදිත මත සහනාධාර අඩු කළ බදු | 1 500 |

වගුවේ දී ඇති දත්ත භාවිත කරමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම (ලකුණු 02යි)

(ආ) දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02යි)

(ඉ) දළ දේශීය ඉතුරුම් (ලකුණු 02යි)

(iii) කල්පිත ආර්ථිකයක ආන්තික ඉතුරුම් නැඹියාව (MPS) 0.2ක් වේ යැයි සිතමු. මෙම ආර්ථිකයේ සංක්‍රාම ගුණකයේ අගය ගණනය කර, රජයේ සංක්‍රාම වියදම් රුපියල් මිලියන 100 කින් වැඩි කිරීම නිසා ජාතික ආදායමේ මුළු වැඩි වීම ගණනය කරන්න. (ලකුණු 04යි)

(iv) රජයේ කටයුතු නොමැති සංවෘත ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.8Y$ සහ ආයෝජනය $I = 80$ වශයෙන් ලබා දී ඇතැයි සිතමු. (වටිනාකම රුපියල් බිලියනවලිනි.)

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම මට්ටම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) සමතුලිත ජාතික ආදායම මට්ටම තීරණය වන ආකාරය පෙන්නුම් කිරීමට රූපසටහනක් අඳින්න. (ලකුණු 04යි)

05. (i) - අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ආරක්ෂාව සහ රාජ්‍ය පරිපාලනය වැනි රාජ්‍ය සේවාවන් නොමිලයේ හෝ ආර්ථික වශයෙන් සැලකිය යුතු මිල ගණන් අය නොකරමින් හෝ සපයන බැවින් ඒවායේ නිමැවුමේ වටිනාකම විකුණුම් හෝ වෙළෙඳපොළ ගනුදෙනු හරහා මැනිය නොහැකි ය.

එබැවින් SNA 2008 නිර්දේශ කරන්නේ පිරිවැය පාදක ප්‍රවේශය (එනම් අගය එකතු කිරීමේ ක්‍රමය) භාවිත කිරීම ය. එම ක්‍රමය යටතේ නිමැවුමේ වටිනාකම නිෂ්පාදනයේ දී භාවිත කරන යෙදවුම් පිරිවැයේ එකතුවට සමාන වේ.

(ලකුණු 02යි)

- SNA 2008 ට අනුව රජයේ සේවාවන්ගේ නිමැවුම් වටිනාකම ඇස්තමේන්තුකර ඇත්තේ පහත සඳහන් ආකාරයට පිරිවැය සංරචකවල එකතුවක් ලෙසට ය.

නිමැවුම් වටිනාකම = සේවක ගෙවීම් (වැටුප්, වේතන සහ විශ්‍රාම දීමනා) + අතරමැදි පරිභෝජනය + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය (ක්ෂයවීම්) + නිෂ්පාදනය මත සහනාධාර අඩු කළ අනෙකුත් බදු (ඇත්නම්)

(ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(ii) (අ) - මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම (GVO) = නිමැවුමේ දළ එකතු කළ අගයන් (GVA) + නිෂ්පාදනයට යොදාගත් අතරමැදි යෙදවුම් (අතරමැදි පරිභෝජනය) (ලකුණු 01යි)

- මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම = කෘෂි කර්මය + කර්මාන්ත + සේවා අංශවල දළ එකතු කළ අගයන් + අතරමැදි පරිභෝජනය

$= 1500 + 4500 + 9500 + 0 = 15500$

නිමැවුමේ දළ වටිනාකම = රු.මිලියන 15500 (ලකුණු 01යි)

(ආ) දළ දේශීය නිෂ්පාදිතය :

- මූලික මිල යටතේ නිමැවුමේ දළ එකතු කළ අගය (GVA) + නිෂ්පාදිත මත සහනාධාර අඩු කළ බදු (ලකුණු 01යි)
- ද.දේ.නි. = $1500 + 4500 + 9500 + 1500 = 17,000$

= රු.මිලියන 17,000 (ලකුණු 01යි)

(ඉ) දළ දේශීය ඉතුරුම් ($S_D$) = දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය + ශුද්ධ අපනයන (ලකුණු 01යි)

දළ දේශීය ඉතුරුම් ($S_D$) $= 4500 + (2000 - 3000)$

$= 4500 + (-1000)$

$= 3500$

රු.මිලියන 3,500 (ලකුණු 01යි)

(මුළු ලකුණු 06යි)

(iii) - සංක්‍රාම ගුණකය :

$$K_{Tr} = \frac{b}{1-b} = \frac{MPC}{1-MPC}$$ (ලකුණු 01යි)

- ආන්තික පරිභෝජන නැඹියාව (MPC) = ~~1-MPC~~

$= 1 - 0.2 = 0.8$

- සංක්‍රාම ගුණකය ($K_{Tr}$) $= \frac{MPC}{1-MPC} = \frac{0.8}{1-0.8} = \frac{0.8}{0.2} = 4$ (ලකුණු 01යි)

- රු.මිලියන 100කින් රජයේ සංක්‍රාම වියදම් වැඩි වීම ආදායමට බලපාන ආකාරය :

ආදායම වෙනස් වීම ($\Delta Y$) = $K_{Tr}$ x සංක්‍රාම වියදම් වැඩි වීම (ලකුණු 01යි)

$= 4 \times 100 = 400$

$\Delta Y$ = රු.මිලියන 400 (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)


(iv) (අ) සමතුලිත ආදායම :

- $Y = C + I + G + (X - M)$ (ලකුණු 01යි)
- $Y = 200 + 0.8Y + 80 + 0 + 0$
- $Y = 280 + 0.8Y$
- $Y - 0.8Y = 280$

$0.2Y = 280$

$Y = 1400$ (ලකුණු 01යි)

(ආ) සමතුලිත ආදායම තීරණය වන ආකාරය රූපසටහනක දක්වීම.




(I වක්‍රයට ලකුණු 01)

(C වක්‍රයට ලකුණු 01යි)

(C + I වක්‍රයට ලකුණු 01යි)

(Y = E සමතුලිත ලක්ෂ්‍යය දක්වීමට ලකුණු 01)

(මුළු ලකුණු 04යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

### 06 වන ප්‍රශ්නය

6. (i) මුදලේ අභ්‍යන්තර වටිනාකම නිර්වචනය කර එය ආර්ථිකයක් තුළ පොදු මිල මට්ටම හා සම්බන්ධ වන්නේ කෙසේ දැ'යි සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) මුදල් ප්‍රමාණවාදී න්‍යාය ව්‍යුත්පන්න කිරීමට විනිමය සමීකරණය භාවිත කිරීමේ දී යොදා ගැනෙන උපකල්පන දක්වන්න. නූතන ආර්ථිකයන්හි මෙම උපකල්පන කෙතරම් යථාර්ථවාදී දැ'යි පරීක්ෂා කරන්න. (ලකුණු 04යි)

(iii) කල්පිත වාණිජ බැංකුවක සරල කරන ලද ශේෂ පත්‍රයක් පහත දක්වා ඇත.

| වගකීම් (රු.) | | වත්කම් (රු.) | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 200 000 | අවශ්‍ය සංචිත | 10 000 |
| ප්‍රාග්ධනය | 120 000 | අධි සංචිත | 4 000 |
| | | ණය | 180 000 |
| | | සුරැකුම්පත් | 50 000 |
| | | ගොඩනැගිලි | 76 000 |
| එකතුව | 320 000 | එකතුව | 320 000 |

(අ) අවශ්‍ය සංචිත අනුපාතය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) තැන්පත්කරුවෙක් බැංකුවෙහි ඇති තම ජංගම ගිණුමෙන් රු. 20 000ක මුදලක් ආපසු ගන්නා බව උපකල්පනය කරන්න. මෙම මුදල් ආපසු ගැනීම නිසා බැංකුවේ අවශ්‍ය සංචිත කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේ ද? (ලකුණු 02යි)

(ඇ) මෙහි දී බැංකුව කිසිදු ණයක් ආපසු කැඳවනු නො ලැබේ යැ'යි උපකල්පනය කළහොත්, ඉහත දක්වන ලද මුදල් ඉවතට ගැනීම සිදුවන අවස්ථාවේදී ම අවශ්‍ය සංචිත අනුපාතය පවත්වා ගැනීමට බැංකුවට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 02යි)

(iv) 2023 නව මහ බැංකු පනතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ දක්වන්න. (ලකුණු 02යි)

(v) මහ බැංකු පනතේ හඳුන්වා දී ඇති නව මූල්‍ය ප්‍රතිපත්ති රාමුව විස්තර කරන්න. එය ඊට පෙර පැවති ප්‍රතිපත්ති රාමුවෙන් වෙනස් වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

06.(i) - මුදලේ අභ්‍යන්තර වටිනාකම යන කිසියම් රටක් තුළ මුදලේ මිල දී ගැනීමේ ශක්තිය හෙවත් ක්‍රය ශක්තියයි. එනම් මුදල් ඒකකයකට රට තුළ මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණයයි. දේශීය ආර්ථිකය තුළ මුදල් ඒකකයක් මූර්ත භාණ්ඩ වශයෙන් කොපමණ වටිනාකමක් තිබේද යන්න එය පෙන්නුම් කරයි. (ලකුණු 01යි)

- මුදලෙහි අභ්‍යන්තර වටිනාකම සහ පොදු මිල මට්ටම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් ඇත. (ලකුණු 01යි)

- පොදු මිල මට්ටම ඉහළ යන විට (උද්ධමනකාරී තත්ත්වයක්) මුදලෙහි අභ්‍යන්තර වටිනාකම හෙවත් ක්‍රය ශක්තිය පහළ වැටේ. මක්නිසාද යත් මුදල් ඒකකයකට මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය පෙරට වඩා අඩු ප්‍රමාණයක් වන බැවිනි. අනික් අතට මිල මට්ටම පහළ වැටෙන විට (අවධමනකාරී තත්ත්වයක්) මුදලෙහි අභ්‍යන්තර වටිනාකම ඉහළ යයි. මන්ද යත් සමාන මුදල් ප්‍රමාණයකට පෙරට වඩා වැඩි භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් ලබා ගත හැකි බැවිනි. (ලකුණු 01යි)

(මුළු ලකුණු 03යි)

(ii) - විනිමය සමීකරණය ඔස්සේ මුදල් ප්‍රමාණවාදී න්‍යාය ව්‍යුත්පන්න කිරීමට යාමේ දී ආර්ථික විද්‍යාඥයෝ පහත දැක්වෙන උපකල්පන කරති.

- කෙටිකාලයේ දී මුදලේ සංසරණ ප්‍රවේගය (V) ස්ථාවර ව පවතී. (ලකුණු 01යි)
- කෙටිකාලයේ දී මූර්ත නිමැවුම (Y) පූර්ණ සේවා නියුක්ති මට්ටමෙහි ස්ථාවර ව පවතී. (ලකුණු 01යි)

- මෙම උපකල්පන නූතන ආර්ථිකයන්හි අතිශයින් සරල වන අතර ම යථාර්ථවාදී ද නොවේ.

- පොලී අනුපාතිකවල වෙනස්වීම්, ඩිජිටල් ගෙවීම් පද්ධති, මූල්‍ය නවෝත්පාදනයන්, විශ්වාසය (confidence) යන සාධකයන්හි බලපෑම මත සංසරණ ප්‍රවේගය උච්චාවචනයන්ට පාත්‍ර වේ. (ලකුණු 01යි)

- ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති මට්ටමෙහි ස්ථාවර ව පවතී ය යන උපකල්පනය ද අතාත්වික ය. බොහෝ විට සැබෑ ආර්ථිකයන් ක්‍රියාත්මක වන්නේ සම්පූර්ණ ධාරිතාවට වඩා අඩු මට්ටමකිනි. විශේෂයෙන් කෙටිකාලයේ දී නිමැවුම් මට්ටම සමාහාර ඉල්ලුම ප්‍රතිචාර වශයෙන් වෙනස් වේ. (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(iii) (අ) අවශ්‍ය සංචිත අනුපාතය :

- අවශ්‍ය සංචිත ප්‍රමාණය ÷ මුළු ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය (ලකුණු 01යි)
- $10000 \div 200000 = 0.05 = 5\%$ (ලකුණු 01යි)

(ආ) රු. 20,000 ආපසු ගත් විට අවශ්‍ය සංචිතයේ හටගන්නා වෙනස :

- අවශ්‍ය සංචිතයේ වෙනස = මුදල් ආපසු ගැනීමට පෙර අවශ්‍ය සංචිතය - මුදල් ආපසු ගත් පසු අවශ්‍ය සංචිතය (ලකුණු 01යි)
- මුදල් ආපසු ගැනීමට පෙර අවශ්‍ය සංචිතය : 10,000
- මුදල් ආපසු ගත් විට අවශ්‍ය සංචිතය $= (200,000 - 20,000) \times 5\%$

$$= 180000 \times \frac{5}{100} = 9000$$

- අවශ්‍ය සංචිතයේ වෙනස $= 10000 - 9000 = 1000$

= රු. 1000 (ලකුණු 01යි)

(ඉ)
- අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ ඔස්සේ අතිරික්ත සංචිත ඇති වෙනත් වාණිජ බැංකුවකින් අරමුදල් ණයට ලබා ගැනීම.
- අවසාන ණය දෙන්නා වශයෙන් කටයුතු කරන මහ බැංකුවෙන් ණය වශයෙන් හෝ වට්ටම් කවුළුවෙන් හෝ අරමුදල් ණයට ගැනීම.
- බැංකුව සතු ද්‍රවශීල වත්කම් (සුරැකුම් පත්) ප්‍රමාණයක් මුදල් වෙළෙඳපොළෙහි අලෙවිකොට අවශ්‍ය සංචිත සපුරා ගැනීම.

(එක් ක්‍රමයකට ලකුණු 01 බැගින් ඕනෑම ක්‍රම දෙකකට ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ :

- දේශීය මිල මට්ටමෙහි ස්ථායිතාව අත්කර ගැනීම සහ පවත්වා ගැනීම. (ලකුණු 02යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ නව මූල්‍ය ප්‍රතිපත්ති රාමුව :

- ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූල ව මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වගකිව යුතු ය.

(ලකුණු 01යි)

- මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර ඇති කර ගනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ ඉලක්කගත මට්ටම්වල උද්ධමන අනුපාතිකය පවත්වා ගැනීම මූල්‍ය ප්‍රතිපත්ති රාමුව අරමුණු කරයි.

වර්තමානයේ ක්‍රියාත්මක වන මූල්‍ය ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය 5% මට්ටමෙහි පවත්වා ගෙන යාමට මහ බැංකුවට නියෝග කොට ඇත. (ලකුණු 01යි)

වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති රාමුව පෙර පැවැති රාමුවෙන් වෙනස්වන ආකාරය :

- උද්ධමන ඉලක්කය සපුරා ගැනීම සඳහා කෙටිකාලීන පොලී අනුපාතික අපේක්ෂිත මාර්ගය ඔස්සේ මෙහෙයවීම සඳහා මහ බැංකුව එක් දින පොලී අනුපාතිකය (OPR) භාවිත කරයි. එය මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය සංඥා කරන ප්‍රධානතම මූල්‍ය ප්‍රතිපත්ති මෙවලමයි. එක් දින පොලී අනුපාතිකය හඳුන්වාදීමට පෙර නිත්‍ය තැන්පතු අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යන නිත්‍ය පහසුකම් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස ක්‍රියා කළේ ය. (ලකුණු 02යි)

- මීට පෙර මහ බැංකුව මූල්‍ය ඉලක්කකරණය (monetary targeting) සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය (FIT) යන දෙකෙහි ම ලක්ෂණ සහිත වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් තුළ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේ ය. එම රාමුව යටතේ මහ බැංකුව උද්ධමනය මැද තනි ඉලක්කම් මට්ටම්වල ස්ථාවර කිරීමට උත්සාහ කළේ ය. මුදල් ඉලක්ක කිරීම් රාමුවක් යටතේ මුදල් සැපයුම් වෙනස්කම් මිල ස්ථායිතාවට බලපාන ප්‍රධාන හේතු සාධක ලෙස සැලැකේ.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 05යි)

5

**07 වන ප්‍රශ්නය**

7. (i) නිෂ්පාදනයේ සෘණ බාහිරතා නිර්වචනය කර එය වෙළෙඳපොළ අසාර්ථකත්වයට හේතු වන ආකාරය රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) රජයේ පුනරාවර්තන වියදම් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? ශ්‍රී ලංකා රජයේ අයවැය ලේඛනයෙහි පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක තුන දක්වන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකාවේ ලාභ ලබන ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය තුනක් නම් කරන්න. (ලකුණු 03යි)

(iv) 2022 වර්ෂයේ ආර්ථික අර්බුදයෙන් පසුව ශ්‍රී ලංකාව හඳුන්වා දුන් ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) නිර්වචනය කර ශ්‍රී ලංකා රජයේ අයවැය හිඟය අඩු කිරීමට සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සාක්ෂාත් කර ගැනීමට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)



CamScanner

07 (i) - ඇතැම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමේ දී එහි නිෂ්පාදනය හෝ පරිභෝජන ක්‍රියාවට සම්බන්ධ නොවන තෙවන පාර්ශ්වයක් මත බාහිර පිරිවැයක් ඇති කිරීම නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක් ලෙස හැඳින්වේ.


- වෙළෙඳපොළ බාහිර පිරිවැය නොසලකා හරිමින් සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම මට්ටමට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන බැවින් නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක් වෙළෙඳපොළ අසාර්ථකත්වයට හේතු වේ. (ලකුණු 01යි)

- වෙළෙඳපොළ තුළ කොපමණ නිෂ්පාදනය කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී නිෂ්පාදන ආයතන සැලකිල්ලට ගන්නේ තමන්ගේ පෞද්ගලික ආන්තික පිරිවැය (PMC) පමණි. කෙසේ වෙතත් බාහිර පිරිවැය (උදා- පරිසර දූෂණය, පරිසර හායනය) හේතුවෙන් නිෂ්පාදනයේ සමාජ ආන්තික පිරිවැය (SMC) පෞද්ගලික ආන්තික පිරිවැයට වඩා විශාල විය හැකි ය. (ලකුණු 01යි)

- රූපසටහනක් ආධාරයෙන් පැහැදිලි කිරීම

නිදහස් වෙළෙඳපොළ සමතුලිතය හටගන්නේ ඉල්ලුම් වක්‍රය (D) පෞද්ගලික ආන්තික පිරිවැය (PMC) පිළිබිඹු කරන සැපයුම් වක්‍රය සමග ඡේදනය වන ලක්ෂ්‍යයේ දී ය. එහි දී සැපයුම් ප්‍රමාණය $Q_2$ වේ. මිල $P_2$ වේ. එහෙත් සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම මට්ටම $Q_1$ වේ. එබැවින් $Q_2 - Q_1$ ප්‍රමාණයේ අධි සැපයුමක් වෙළෙඳපොළේ හටගනී. සුභසාධනය අහිමි වී යාමක් ද හට ගනී.

අහිමි වන සුභසාධනය ප්‍රස්තාරයේ දක්වේ.




(විස්තරයට ලකුණු 01යි, නිවැරදි රූපසටහනට ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(ii) - ආණ්ඩුවේ පුනරාවර්තන වියදම් යනුවෙන් අදහස් කරනුයේ එදිනෙදා කටයුතු සඳහා සිදුකෙරෙන කරන අඛණ්ඩ වියදම් වේ. මේවා සෑම වසරක ම සිදු වන අතර නව වත්කම් නිර්මාණය නොකරයි. නමුත් රජයේ කටයුතු පවත්වා ගෙන යාමට සහ මහජන සේවා සැපයීමට ඒවා අවශ්‍ය වේ. (ලකුණු 01යි)

- ශ්‍රී ලංකාවේ පුනරාවර්තන වියදමේ ප්‍රධාන සංරචක තුන :
  - රාජ්‍ය ණය (දේශීය හා විදේශීය) සඳහා පොලී ගෙවීම
  - කුටුම්බ අංශය වෙත පැවරුම් (අස්වැසුම, විශ්‍රාම වැටුප්, පොහොර සහනාධාර ආදිය)
  - රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ වේතන

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(iii)
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
- ලංකා බැංකුව
- මහජන බැංකුව
- ඉතිරිකිරීමේ බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(ලකුණු 01 බැගින් ලකුණු 03යි)

(iv) 2022 ආර්ථික අර්බුදයට පසු ව ශ්‍රී ලංකාවේ හඳුන්වා දෙනු ලැබූ ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ :

- 2022 මැද භාගයේ හදිසි බදු පැකේජයක් (Emergency Tax Package) හඳුන්වාදීම :
  - එකතු කළ අගය මත බද්ද 8% සිට 12% දක්වා වැඩි කිරීම. (පසු ව එය 15% සහ 18% දක්වා වැඩි කරන ලදී.
  - විදුලි සංදේශ ගාස්තුව 11.28% සිට 15% දක්වා වැඩි කරන ලදී.
  - වාර්ෂික පිරිවැටුම රු.මිලියන 120 ඉක්ම වන ව්‍යාපාර සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් (2.5%) හඳුන්වා දීම.
  - 2020/21 සඳහා බදු අයකළ හැකි ආදායම රු.බිලියන 2 ඉක්ම වන පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා 25%ක අධිභාර බද්දක් (Surcharge Tax) පැනවීම.

- ආදායම් බදු ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම (2022 අග භාගයේ දී)
  - 2023 ජනවාරි මාසයේ සිට පෞද්ගලික ආදායම් බද්ද සඳහා වාර්ෂික බදු නිදහස් ආදායම් සීමාව රු.මිලියන 3.0 සිට මිලියන 1.2 දක්වා අඩු කරන ලදී.
  - පෞද්ගලික ආදායම් බදු සඳහා ආන්තික බදු අනුපාතිකය ඉහළ නංවනු ලැබී ය. ආදායම් කාණ්ඩ අනුව නව අනුපාත 6% සිට 36% දක්වා පරාසයකට ගෙන ආවේ ය.
  - ලාභාංශ, පොලී සහ සේවාවන් සඳහා රඳවා ගැනීම් බද්ද අනිවාර්ය කරන ලදී.
  - සංස්ථාපිත ආදායම් බදු අනුපාතික 24% සිට 30% දක්වා ඉහළ නැංවූ අතර සංස්ථාපිත ආදායම් බදුවලට සම්බන්ධ 14% සහනදායි බදු අනුපාතිකය ඉවත් කරන ලදී.
  - [illegible]

- එකතු කළ අගය මත බදු ගෙළපුම් වේගවත් කිරීම සඳහා බදු නිදහස් කිරීම් ඉවත් කිරීම (2023 - 24 කාලය)
  - එකතු කළ අගය මත බදු අනුපාතිකය 2024 වර්ෂයේ දී 15% සිට 18% දක්වා වැඩි කරන ලදී.
  - වැට් බදු ගෙවීම සඳහා ලියාපදිංචි විය යුතු අවම පිරිවැටුම් සීමාව තවදුරටත් පහළට ගෙන එන ලදී.
  - ඉන්ධන, LP ගෑස්, ඖෂධ වැනි ප්‍රධාන අත්‍යවශ්‍ය දෑ ද වැට් බදු ජාලය තුළට ගෙන එන ලදී.
  - නිර්නේවාසිකයන් විසින් ඩිජිටල් සේවා සඳහා 18%ක වැට් බද්ද 2025 අප්‍රේල් සිට ගෙවීම
  - සරල කළ වැට් බද්ද (SVAT) වැට් ආපසු ගෙවීමේ ක්‍රමයක් සමග ප්‍රතිස්ථාපනය කිරීම
  - විදේශීය සේවා සපයන්නන් සඳහා සහනදායක 15%ක සංස්ථාපිත බදු අනුපාතිකයක් නියම කරන ලදී.
  - ඔට්ටු ඇල්ලීම, ක්‍රීඩා (game), මත්පැන්, දුම්කොළවලින් ලැබෙන ලාභ මත 45%ක ඉහළ බදු අනුපාතයක් පැනවීම

- [illegible]



CS CamScanner

- බදු පරිපාලනය සහ අනුකූලතා වැඩි දියුණු කිරීම :
  - විද්‍යුත් ගොනු කිරීම
  - ඉහළ වත්කම් සහිත විශාල බදු ගෙවන්නන්ගේ ඒකකය පිහිටුවීම
  - බදු සඳහා ලියාපදිංචිය අනිවාර්ය කිරීම හා හඳුනා ගැනීමේ අංක (TIN) නිකුත් කිරීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ප්‍රධාන බදු සංශෝධන හතරකට ලකුණු 04යි)

(v) - රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් යනු රාජ්‍ය අංශය විසින් සාම්ප්‍රදායිකව සපයනු ලබන ව්‍යාපෘති හෝ සේවා සඳහා මූල්‍යකරණය, ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රජය සහ පෞද්ගලික අංශයේ ආයතන අතර ඇති කර ගනු ලබන සහයෝගිතා විධි විධාන වේ.

- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යනු රාජ්‍ය අංශය සමග අවදානම් සහ ප්‍රතිලාභ යන දෙක ම බෙදා ගනිමින් පොදු ව්‍යාපෘතියක් හෝ සේවාවක් ලබා දීම සඳහා දෙපාර්ශ්වය අතර ඇති කර ගනු ලබන ගිවිසුම්ගත බැඳීමකි.

(ලකුණු 02යි)

- අයවැය හිඟය අඩු කිරීමට සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අත්කර ගැනීමට රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයට දායක විය හැකි ආකාරය :
  - පෞද්ගලික ප්‍රාග්ධනය සංචල කළ හැකි වීම : යටිතල පහසුකම් සැපයීම වැනි ව්‍යාපෘති සඳහා පෞද්ගලික ප්‍රාග්ධනය යොමු කළ හැකි බැවින් ඒ සඳහා රජයට සෘජුව ම වියදම් දැරීමට හෝ ණය ගැනීමට හෝ අවශ්‍ය නොවේ.

  - රාජ්‍ය මූල්‍ය බර අඩු වීම : ව්‍යාපෘති මූල්‍යකරණය, ඉදිකිරීම සහ ඇතැම්විට මෙහෙයුම් සිදු කිරීම පෞද්ගලික අංශය සමග බෙදා ගෙන කළ හැකි බැවින් ආණ්ඩුවේ අයවැය මත පීඩනය අඩු වේ.

  - කාර්යක්ෂමතාව සහ පිරිවැය - සඵලතාව වැඩි දියුණු වීම : පෞද්ගලික අංශයේ සහභාගිත්වය නිසා ව්‍යාපෘති කළමනාකරණය කළ හැකි වීමෙන් රාජ්‍ය අරමුදල් නාස්තිය අඩු වීමට හේතු වේ.

  - ආදායම් උත්පාදනය : ගාස්තු අය කෙරෙන අධිවේගී මාර්ග, බලශක්ති ව්‍යාපෘති වැනි රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති මගින් රජයට අලුත් ආදායම් මාර්ග නිර්මාණය කර ගත හැකි වන අතර එය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවට සහාය වනු ඇත.

  - අවදානම් බෙදා ගැනීම : ඉදිකිරීම, මූල්‍යනය සහ මෙහෙයුම් කිරීම වැනි කටයුතුවල දී සිදුවිය හැකි ව්‍යාපෘති අවදානම් අර්ධ වශයෙන් පෞද්ගලික අංශයට පැවරිය හැකි බැවින් රජයට මුහුණ පෑමට සිදු විය හැකි අනපේක්ෂිත මූල්‍ය කම්පන වැළැකේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(මුළු ලකුණු 05යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**08 වන ප්‍රශ්නය**

8. (i) සාපේක්ෂ වාසිය සහ තරගකාරිත්ව වාසිය අතර මූලික වෙනස උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) ද්විත්ව-සටහන් මූලධර්මයට අනුව පහත සඳහන් ජාත්‍යන්තර ගනුදෙනුවල බැර සහ හර සටහන් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ගිණුමේ වාර්තා කරනු ලබන්නේ කෙසේ ද?

(අ) ශ්‍රී ලාංකික නේවාසිකයෙකුට විදේශයකින් ඩොලර් 500ක ප්‍රේෂණයක් ලැබීම

(ආ) ශ්‍රී ලාංකික කෘෂි රසායන සමාගමක් විසින් විශේෂිත කෘෂි රසායනයක් දේශීය වශයෙන් නිපදවීම සඳහා ඩොලර් මිලියන 50ක් ගෙවා ස්වාධිකාර (patent) බලපත්‍රයක් මිලට ගැනීම

(ඉ) ශ්‍රී ලංකා රජය නිව්යෝර්ක් මුදල් වෙළෙඳපොළෙහි සංවර්ධන බැඳුම්කර අලෙවි කොට ඩොලර් මිලියන 200ක ණය මුදලක් ලබා ගැනීම (ලකුණු 03යි)

(iii) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය අනුපාතිකය තීරණය කරන ප්‍රධාන ඉල්ලුම හා සැපයුම සාධක කවරේ ද? (ලකුණු 04යි)

(iv) සෘජු විදේශ ආයෝජන යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමෙහි ලා අනුගමනය කළ හැකි උපායමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) ශ්‍රී ලාංකික අපනයන සඳහා එක්සත් ජනපද තීරුබදු වෙනස්වීම ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයට හා විදේශ විනිමය ඉපැයීම්වලට බලපාන්නේ කෙසේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 05යි)

08. (i) සාපේක්ෂ වාසිය සහ තරගකාරී වාසිය අතර මූලික වෙනස :

- සාපේක්ෂ වාසිය සහ තරගකාරිත්ව වාසිය අතර මූලික වෙනස පවතින්නේ ඒවායේ විශ්ලේෂණ පදනම තුළ ය.
  සාපේක්ෂ වාසිය යනු කාර්යක්ෂමතාව සහ ආවස්ථික පිරිවැය කෙරෙහි අවධානය යොමු කරන ආර්ථික සංකල්පයක් වන අතර තරගකාරී වාසිය යනු වෙළෙඳපොළ කාර්ය සාධනය සහ ලාභදායිතාව කෙරෙහි අවධානය යොමු කරන ව්‍යාපාර උපාය මාර්ගික සංකල්පයකි.

- සාපේක්ෂ වාසිය යනු වෙනත් රටකට (හෝ ආයතනයකට) වඩා අඩු ආවස්ථික පිරිවැයකින් කිසියම් නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීමට රටකට (ආයතනයකට) ඇති හැකියාවයි. සියලු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී එක් රටක් අනිත් රටට වඩා කාර්යක්ෂම වුව ද වෙළෙඳාම සියලු පාර්ශ්වයන්ට වාසි ගෙන දෙන්නේ ඇයි ද යන්න එය පැහැදිලි කරයි.
  තරගකාරිත්ව වාසිය යනු උසස් ගුණාත්මකභාවය, සන්නාම, ප්‍රතිරූපය (brand image), නවෝත්පාදනය හෝ පිරිවැය නායකත්වය (cost leadership) වැනි සාධක මස්සේ වෙළෙඳපොළ තුළ රටකට හෝ සමාගමකට හෝ තරගකරුවන් අභිබවායාමට ඉඩ සලසන අද්විතීය ශක්තීන් හෝ ගුණාංග වේ.

(ලකුණු 02යි)

- නිදසුන් :
  - සාපේක්ෂ වාසිය : ශ්‍රී ලංකාව හා ඉන්දියාව යන දෙරටට ම රෙදිපිළි සහ තේ නිෂ්පාදනය කළ හැකි ය. අතිරේක තේ ඒකකයක් නිපදවීමේ දී ශ්‍රී ලංකාව කැප කරනු ලබන්නේ ඉන්දියාවට සාපේක්ෂ ව අඩු රෙදි පිළි ඒකක ප්‍රමාණයකි. එබැවින් ශ්‍රී ලංකාවට තේ නිෂ්පාදනයේ සාපේක්ෂ වාසියක් ඇත.
    අනික් අතට ඉන්දියාව රෙදිපිළි නිෂ්පාදනයේ දී වැඩිපුර රෙදි ඒකකයක් නිපදවීම සඳහා කැප කරන්නේ අඩු තේ ඒකක ප්‍රමාණයකි. එබැවින් ඉන්දියාවට රෙදිපිළි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසියක් ඇත. සාපේක්ෂ වාසි ඇති භාණ්ඩ නිෂ්පාදනය විශේෂ ප්‍රාගුණ්‍යනය කොට වෙළෙඳාම් කිරීමෙන් දෙරටට ම වාසි ලබා ගත හැකි ය. (ලකුණු 01යි)

  - ශක්තිමත් වෙළෙඳ නාම ප්‍රතිරූපය, නවෝත්පාදනය, වැනි හේතු මත ඇපල් සමාගමට



CamScanner

ස්මාර්ට් ජංගම දුරකථන වෙළෙඳපොළෙහි තරඟකාරී වාසිය ඇත.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(ii)(අ) - ශ්‍රී ලාංකික නේවාසිකයෙකු ඩොලර් 500ක විදේශ ප්‍රේෂණයක් ලැබීම :

- ජංගම ගිණුමේ ද්විතීය ආදායම් උපශීර්ෂය බැර (+) = $500
- මූල්‍ය ගිණුමේ වෙනත් ආයෝජන උප ශීර්ෂය - මුදල් හා බැංකු තැන්පතු හර (-) = $500

(ලකුණු 01යි)

(ආ) - ශ්‍රී ලාංකික කෘෂිරසායනික සමාගමක් ස්වාධිකාර බලපත්‍රයක් මිල දී ගැනීම.

- ප්‍රාග්ධන ගිණුමේ නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හර (-) = $ මිලියන 50
- මූල්‍ය ගිණුමේ වෙනත් ආයෝජන උප ශීර්ෂය - මුදල් හා බැංකු තැන්පතු බැර (+) = $ මිලියන 50

(ලකුණු 01යි)

(ඉ) - ශ්‍රී ලංකා රජය නිව්යෝර්ක් මුදල් වෙළෙඳපොළෙහි සංවර්ධන බැඳුම්කර අලෙවි කොට ණය මුදලක් ලබාගැනීම.

- මූල්‍ය ගිණුමේ වෙනත් ආයෝජන උප ගිණුම යටතේ රජයේ ණය ශීර්ෂය බැර (+) = $ මිලියන 200
- මූල්‍ය ගිණුමේ වෙනත් ආයෝජන උප ගිණුම - මුදල් හා බැංකු තැන්පතු හර (-) = $ මිලියන 200

(ලකුණු 01යි)

(මුළු ලකුණු 03යි)

(iii) විදේශ විනිමය අනුපාතිකය තීරණය කෙරෙන ප්‍රධාන ඉල්ලුම් හා සැපයුම් සාධක :

- ගෙවුම් ශේෂ තත්ත්වය : ජංගම ගිණුම (අපනයන/ ආනයන) ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම (සෘජු විදේශ ආයෝජන, කළඹ ආයෝජන ණය ලැබීම් හා ගෙවීම්)
- උද්ධමන අනුපාතිකයේ වෙනස්වීම් (වෙළෙඳ පාර්ශ්වකරුවන්ට සාපේක්ෂ ව)
- පොලී අනුපාතිකවල වෙනස්වීම්
- රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම
- සමපේක්ෂණය සහ වෙළෙඳපොළ අපේක්ෂාවන්
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය
- බාහිර සාධක (ගෝලීය හා භූ දේශපාලනික වෙනස්වීම්)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 02 කට ලකුණු 02යි)

(මුළු ලකුණු 04)

(iv) - විදේශ සෘජු ආයෝජන යනු කිසියම් රටක පුද්ගලයෙක්, සමාගමක් හෝ රජයක් විසින් තවත් රටක පිහිටි ව්‍යාපාරයකට හෝ නිෂ්පාදන වත්කමකට හෝ කරනු ලබන ආයෝජනයකි. එම ආයෝජනය මගින් එම ව්‍යාපාරය කෙරෙහි දිගුකාලීන උනන්දුවක් (lasting interest) සහ සැලකිය යුතු පාලනයක් ඇති කරමින් ලාභයක් උපයා ගැනීම අරමුණු කරගනී.

(ලකුණු 01යි)

- විදේශ ආයෝජකයන් ආකර්ශණය කර ගනු පිණිස ශ්‍රී ලංකාවට ගත හැකි උපාය මාර්ග :
  - සාර්ව ආර්ථික සහ දේශපාලන ස්ථායිතාව තහවුරු කිරීම
  - නීතිමය හා නියාමන රාමුව ශක්තිමත් කිරීම
  - යටිතල පහසුකම් සහ සේවා සැපයුම් (logistics) වැඩි දියුණු කිරීම
  - Digital ව්‍යාපාර පරිසර ...



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

- තරගකාරී හා ස්ථාවර බදු ව්‍යුහයක් පැවතීම
- කුසලතා පූර්ණ මානව සම්පත් සංවර්ධනය කිරීම
- විශේෂ ආර්ථික කලාප (SEZ) පුළුල් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම
- වෙළෙඳ හා කලාපීය ඒකාබද්ධතාව ශක්තිමත්කිරීම
- නැගී එන අංශවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම (පුනර්ජනනීය බලශක්තිය, සංචාරක ව්‍යාපාරය, කෘෂිකාර්මික අපෙදාම් යනාදිය)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(v) - අමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තයකි. විශේෂයෙන් ඇඟලුම්, රබර් ආශ්‍රිත නිෂ්පාදිත, මුහුදු ආහාර සහ තේ අපනයන අතර ප්‍රධාන තැනක් හිමිකර ගනී. එබැවින් එක්සත් ජනපද තීරු බදු ප්‍රතිපත්තියේ ඕනෑම වෙනසක් ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනයට සහ විදේශ විනිමය ගලා ඒමට සෘජුව ම බලපායි.

- ශ්‍රී ලංකාවේ අපනයන සඳහා විශේෂයෙන් ඇඟලුම් සඳහා (ඇඟලුම් ආදායමෙන් 40%කට ආසන්න ප්‍රමාණයක්) ප්‍රධාන වෙළෙඳපොළක් වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය වන බැවින් මෙම තීරු බදු අපනයන ආදායම් පහළ හෙළන අතර එමනිසා විදේශ විනිමය ගලා ඒම ද සංකෝචනය වනු ඇත.

(ලකුණු 02යි)

ගෙවුම් ශේෂය මත බලපෑම :

- ශ්‍රී ලංකාවේ අපනයන මත පනවන ලද 30%ක ඉහළ තීරු බදු නිසා ශ්‍රී ලංකා භාණ්ඩ එක්සත් ජනපද වෙළෙඳපොළ තුළ මිල අධික වන අතර වඩාත් හිතකර වෙළෙඳ ගිවිසුම් ඇති කර ගෙන සිටින අනෙකුත් ආසියානු සැපයුම්කරුවන්ගේ රටවල් හා සසඳන විට ඒවායේ මිල තරගකාරීත්වය අඩු වේ. ඉහළ තීරු බදු නිසා එක්සත් ජනපදයෙහි ශ්‍රී ලාංකික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම අඩු වන අතර අපනයන පරිමාව සහ අපනයන ලැබීම් අඩු වනු ඇත.

- අපනයන ආදායම අඩු වීම නිසා ජංගම ගිණුමේ ප්‍රධාන අංගයක් වන වෙළෙඳ ශේෂය අයහපත් අතට යොමු විය හැකි ය. ජංගම ගිණුමේ හිඟය පුළුල් විය හැකි ය.

(ලකුණු 02යි)

විදේශ විනිමය ඉපැයීම් කෙරෙහි බලපෑම :

- රට තුළට ඩොලර් ගලා ඒම අඩු විය හැකි ය. අපනයනකරුවන් ඩොලර් අඩු වෙන් උපයන අතර එමගින් විදේශ විනිමය ගලා ඒම අඩු වේ.

- විනිමය අනුපාතිකය මත පීඩන ඇති විය හැකි ය. අඩු ඩොලර් ගලා ඒමත් සමග ශ්‍රී ලංකා රුපියල ක්ෂයවීමට ඉඩ ඇත.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 05යි)



CamScanner

**09 වන ප්‍රශ්නය**

9. (i) තිරසාර සංවර්ධනයේ ප්‍රධාන කුළුණු තුන නමකර ඒවා එකිනෙක අතර ඇති අන්තර් සම්බන්ධතා පැහැදිලි කරන්න. (ලකුණු 14යි)

(ii) හුදෙක් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙන් පමණක් පිළිබිඹු කළ නොහැකි සංවර්ධනයේ විවිධ පැතිකඩ මානව සංවර්ධන දර්ශකය විසින් ග්‍රහණය කරගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

(iii) (අ) ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය පහළ මට්ටමක පැවතීමට දායක වන ප්‍රධාන සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03යි)

(iv) (අ) නිරපේක්ෂ දරිද්‍රතාව නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාව මනිනු ලබන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

09. (i) තිරසාර සංවර්ධනයේ ප්‍රධාන කුළුණු තුන :

- ආර්ථික තිරසාරභාවය : මින් අදහස් කරනුයේ සම්පත් කාර්යක්ෂම ව භාවිත කර අනාගතුර සැමට අවස්ථා නිර්මාණය කෙරෙන සියල්ලන් ම ඇතුළත් වූ (inclusive) ස්ථාවර ආර්ථික වෘද්ධියක් පවත්වා ගැනීමයි.

- සමාජ තිරසාරභාවය : මින් අදහස් කරන්නේ සම්පත් සහ අවස්ථාවන්ට (opportunities) සැමට ප්‍රවේශ විය හැකි සාධාරණ ප්‍රවේශයක් ලබා දීම, සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සහ සමාජයේ සියලු සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම ය.

- පාරිසරික තිරසාරභාවය : මේ යටතේ ස්වාභාවික සම්පත් වගකීමෙන් යුතු ව භාවිත කරන බව, පරිසර පද්ධති ආරක්ෂා කරන බව සහ පාරිසරික හායනය අවම කරන බව සහතික කරයි.

(ලකුණු 03යි)

- අන්තර් සම්බන්ධතාව :
  - ආර්ථික වර්ධනය ස්වාභාවික සම්පත් මත රඳා පවතී. ඒවා අධික ලෙස සූරා කෑම පරිසරයට හානිකරන අතර අවසානයේ ආර්ථික ඵලදායිතාව අඩු කරයි.
  - සමාජ හා ආර්ථික තිරසාරභාවයෙන් ද එකිනෙකට බැඳී ඇත. සෞඛ්‍ය සම්පන්න උසස් ජනගහනයක් ආර්ථික ඵලදායිතාව මෙහෙයවන අතර සර්වග්‍රාහී ආර්ථික ප්‍රතිපත්ති (inclusive economic policies) දරිද්‍රතාව සහ අසමානතාව අඩු කරයි.
  - සමාජ හා පාරිසරික තිරසාරභාවය ද බැඳී ඇත. පාරිසරික හායනය මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වයට හා ජීවනෝපායට හානි කරයි. පරිසර පද්ධති ආරක්ෂා කිරීම සමාජ යහපැවැත්ම හා ආහාර සුරක්ෂිතතාවට සහාය වේ.

(ඕනෑම එක් සම්බන්ධතාවකට ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(ii) - සංවර්ධනය බහුමාන සංකල්පයක් වන අතර එය ආර්ථික වර්ධනයෙන් ඔබ්බට ගොස් සමාජ, දේශපාලන, පාරිසරික සහ මානව සාධක ඇතුළත් කර ගනී.

(ලකුණු 01යි)

- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය රටක නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල මුළු වටිනාකම මනියි. එහෙත් එය මිනිසුන් ජීවත් වන ආකාරය, ඔවුන්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

හෝ සමානාත්මතාවය ගැන කිසිවක් නොකියයි. කිසියම් රටක ඉහළ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයක් තිබිය හැකි නමුත් තවමත් බොහෝ මිනිසුන් දුර්වල ජීවන තත්ත්වයෙන් පීඩා විඳිමින් සිටිය හැකි ය.

(ලකුණු 01යි)

- මානව සංවර්ධන දර්ශකය මානව යහපැවැත්මේ බහුවිධ මානයන් ග්‍රහණය කර ගන්නා සංයුක්ත මිනුමක් වේ. එය ආර්ථික නිමැවුම කෙරෙහි පමණක් අවධානය යොමු කරන දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට වඩා සංවර්ධනය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දේ. සංවර්ධනයේ බහුවිධ මානයන් ග්‍රහණය කර ගනිමින් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙන් ඔබ්බට යාමට මානව සංවර්ධන දර්ශකය නිර්මාණය කරන ලදී. එය මූලික මානයන් තුනක් කැටි කොට දක්වේ.

(ලකුණු 01යි)

- එම මානයන් තුන නම් :
  - සෞඛ්‍යය (උපතේ දී ආයු අපේක්ෂාව)
  - අධ්‍යාපනය (පාසල් අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාව)
  - ජීවන තත්ත්වය (ක්‍රය ශක්ති සාම්‍ය මත ගළපන ලද දළ ජාතික ආදායම)

(ලකුණු 02යි)

(මුළු ලකුණු 05යි)

(iii) (අ) - ශ්‍රම බලකා සහභාගිත්වය අනුපාතිකය )

- වයස අවුරුදු 15 සහ ඊට වැඩි ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය අවුරුදු 15 හා ඊට වැඩි මුළු ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන්
- සේවා වියුක්ත හා සේවා නියුක්ත ජනගහනය (ශ්‍රම හමුදාව) වැඩ කරන වයසේ (අවුරුදු 15 හා ඊට වැඩි) මුළු ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන්
- $\frac{\text{ශ්‍රම හමුදාව}}{\text{වැඩකරන වයසේ ජනගහනය}} \times 100$

(ඕනෑම එක් නිර්වචනයකට ලකුණු 02යි)

(ආ) - කාන්තා ශ්‍රම සහභාගිත්වය අඩු වීමට බලපාන සාධක

- සංස්කෘතික හා සමාජයීය සම්මතයන්
- කුටුම්බ හා රැකවරණ වගකීම් (household and care responsibility)
- ශ්‍රම වෙළෙඳපොළ තුළ වෙනස් කොට සැලකීම (discrimination)
- රැකියා අවස්ථා හා සේවා කොන්දේසි
- අධ්‍යාපනය හා රැකියා නොගැළපීම්
- සංක්‍රමණ සහ නොවිධිමත් රැකියා
- ප්‍රමාණවත් නොවන මාතෘ හා දෙමාපිය නිවාඩු ප්‍රතිපත්ති
- කාන්තා ව්‍යවසායකත්වය සඳහා සහයෝගය සීමිත වීම සහ මූල්‍ය ප්‍රවේශය සීමිත වීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(මුළු ලකුණු 05යි)

(iv) (අ) - නිරපේක්ෂ දරිද්‍රතාවය යනු පුද්ගලයෙකුට හෝ කුටුම්බයකට ජීවිතයේ මූලික අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය අවම ආදායම් මට්ටමක් හෝ සම්පත් නොමැති වීම ය. ආහාර, පිරිසිදු ජලය, ඇඳුම් පැළඳුම්, නවාතැන්, සෞඛ්‍ය සේවා හා අධ්‍යාපනය, අවම ජීවන තත්ත්වයක් පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

(ලකුණු 02යි)



CamScanner

(ආ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනෙන ආකාරය :

- ජාතික දරිද්‍රතා රේඛාව : ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතා මිනුම් පදනම් වී ඇත්තේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ජාතික දරිද්‍රතා රේඛාව (NPL) මත ය. අවම ජීවන තත්ත්වයක් පවත්වා ගැනීමට අවශ්‍ය මූලික ආහාර සහ ආහාර නොවන අවශ්‍යතා සපුරා ලීමට අවශ්‍ය අවම මාසික වියදම ජාතික දරිද්‍රතා රේඛාව නියෝජනය කරයි. මෙම රේඛාවට පහළින් පරිභෝජන වියදම් ඇති ඕනෑම අයෙකු දුප්පත් ලෙස සැලකේ. (ලකුණු 02යි)

- ලෝක බැංකුව භාවිත කරන ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව : අවම ජීවන මට්ටමක් පවත්වා ගැනීමට දිනකට එක් පුද්ගලයෙකුට අවශ්‍ය කරන ක්‍රය ශක්ති සාම්‍යය මත ගළපන ලද ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය දරිද්‍රතා රේඛාව ලෙස යොදා ගැනේ. පහළ මැදි ආදායම් රටක් වශයෙන් ශ්‍රී ලංකාව සඳහා අදාළ දරිද්‍රතා රේඛාව වනුයේ එක්සත් ජනපද ඩොලර් 4.20කි. (2025 ජූලි මාසයට පෙර මෙම ප්‍රමාණය ඩොලර් 3.65ක් විය.)

(ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

**10 වන ප්‍රශ්නය**

10. (i) 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට දායක වූ ප්‍රධාන ප්‍රතිපත්තිමය අසමත්වීම කවරේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය වෙතෙත් කර තිරසාර ලෙස පවත්වා ගැනීම සඳහා කඩිනමින් අවශ්‍ය කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර පහක් සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iii) ඉහළ එකතු කළ අගයක් ලබා දෙන නිෂ්පාදන හා සේවා අංශ සංවර්ධනයට සහායවීම සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කළ යුතු වැදගත් කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05යි)

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික කාර්යසාධනය වැඩි දියුණු වී ඇත්තේ කෙසේ ද? එයි ලා තවදුරටත් පවත්නා ප්‍රධාන අභියෝග කවරේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

10. (i) 2022 ආර්ථික අර්බුදයට දායක වූ ප්‍රතිපත්ති අසමත් වීම :

- තිරසාර නොවූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති :
  - අධික අයවැය හිඟය, ඉහළ රාජ්‍ය ණය, 2019 දී අවිධිමත් ලෙස බදු කපා හැරීම

- දුර්වල රාජ්‍ය ණය කළමනාකරණය :
  - අධික ලෙස විදේශ ණය ලබා ගැනීම, සහනදායී බහු පාර්ශ්වීය ණය වෙනුවට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවලින් (සෛවරී බැඳුම්කර) කෙටිකාලීන ඉහළ පොලී ණය ගැනීම
  - ණය ලබා ගෙන මූල්‍යණය කරමින් ආර්ථික වශයෙන් ශක්‍ය නොවූ යටිතල පහසුකම් ගොඩ නැගීම : (හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපළ)

- මූල්‍ය ප්‍රතිපත්තියේ වැරදි කළමනාකරණය :
  - අධික මුදල් මුද්‍රණය
  - අඩු පොලී අනුපාතික ප්‍රතිපත්තිය
  - විනිමය අනුපාතික දෘඪතාව

- අසාර්ථක විදේශ විනිමය ප්‍රතිපත්තිය :
  - විනිමය අනුපාතිකයේ ගැළපුම් ප්‍රමාදය



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

අනුගමනය කළ හැකි ය.

- කාර්මික විවිධාංගකරණය සහ වැඩි දියුණු කිරීම් ප්‍රවර්ධනය කිරීම :
    - අගය දාමය ඉහළට ගෙන යාම දිරිමත් කිරීම
    - උපාය මාර්ග අංශ (ආහාර සැකසීම, වෛද්‍ය උපකරණ, පුනර්ජනනීය බලශක්ති උපකරණ) ඉලක්ක කිරීම
    - කර්මාන්ත පොකුරු (industrial clusters) සහ විශේෂ ආර්ථික කලාප ස්ථාපිත කිරීම

- පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන (R & D) ශක්තිමත් කිරීම :
    - පර්යේෂණ සහ සංවර්ධන වියදම් වැඩි කිරීම (දැනට දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.2%කට වඩා අඩු ය. අවම වශයෙන් 1%ක් දක්වා වැඩි කිරීම
    - නවෝත්පාදන දිරි ගැන්වීම : බදු ප්‍රදාන ලබා දීම
    - විශ්වවිද්‍යාල - කර්මාන්ත සම්බන්ධතා ශක්තිමත් කිරීම

- මානව ප්‍රාග්ධනය සහ කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම :
    - අධ්‍යාපන හා පුහුණු කිරීම් පද්ධති ප්‍රතිසංස්කරණ
    - STEM අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

- කර්මාන්ත සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම :
    - කාර්මික ණය සඳහා විශේෂ පහසුකම් සැලැසීම (සංවර්ධන බැංකු, සහනදායි ණය යෝජනා ක්‍රම)
    - ව්‍යාපාර ප්‍රාග්ධනය (venture capital) සහ කොටස් මූල්‍යකරණය දිරිමත් කිරීම
    - රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

- ඩිජිටල් හා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම :
    - ඊ-වාණිජ්‍යය සහ තොරතුරු හා සන්නිවේදන පාදක සේවා කර්මාන්ත සඳහා සහාය වීමට බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා දත්ත මධ්‍යස්ථාන, ඩිජිටල් පහසුකම් වේදිකා පුළුල් කිරීම
    - නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ තරගකාරිත්වය වැඩි දියුණු කිරීම, ප්‍රවාහන, බලශක්ති සහ සැපයුම් පද්ධති වැඩි දියුණු කිරීම
    - හරිත කාර්මික කලාප ප්‍රවර්ධනය

5

- අපනයන දිශානතිය සහ ගෝලීය වටිනාකම් දාම ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම :
    - වෙළෙඳ පහසුකම් සැපයීම (අපනයන ක්‍රියාපටිපාටි සරල කිරීම, රේගු ප්‍රමාදයන් අඩු කිරීම, අපනයන නැඹුරු ආයෝජනයන් ආකර්ශණය සඳහා ප්‍රමිතීන් සමපාත කිරීම
    - සෘජු විදේශ ආයෝජන ආකර්ශණය කර ගැනීම
    - කලාපීය ඒකාබද්ධතාවන් ශක්තිමත් කිරීම (RCEP, BIMS TEC)

- සේවා අංශයේ සංවර්ධනයට සහාය වීම :
    - තොරතුරු සන්නිවේදන සහ දැනුම පදනම් කරගත් සේවා දිරි ගැන්වීම
    - මෘදුකාංග සංවර්ධනය, මූල්‍ය තාක්ෂණය (fintech) ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (BPO) ප්‍රවර්ධනය



PAST PAPERS WIKI

CamScanner

- ප්‍රතිපත්ති සම්බන්ධීකරණය හා ආයතනික ප්‍රතිසංස්කරණ සහතික කිරීම :
  - ජාතික සංවර්ධන ඉලක්ක සමග සමපාත වන සුසංයෝගී දීර්ඝකාලීන කාර්මික උපාය මාර්ග ඇතුළත් ප්‍රතිපත්තියක් සැකසීම
  - ප්‍රතිපත්ති ඛණ්ඩනය වැළැක්වීමට අමාත්‍යාංශ අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම
  - අධීක්ෂණය හා ඇගයීම

(එක් ප්‍රධාන උපාය මාර්ගයකට ලකුණු 01 බැගින් ප්‍රධාන ක්‍රියාමාර්ග පහකට ලකුණු 05යි)

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික කාර්ය සාධනය ඉහළ ගිය ආකාරය :

- ආර්ථික වර්ධනය ප්‍රකෘති තත්ත්වයට පත් වීම
  - 2022 දී බරපතළ ලෙස බිඳ වැටුණු ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමයෙන් ප්‍රකෘතිමත් තත්ත්වයට ළඟා වෙමින් සිටී. 2024 දී ආර්ථික වෘද්ධිය 5%ක් විය. 2025 වර්ෂයේ දී ද ඒ ආසන්නයට පැමිණ ඇත.

- රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම
  - රාජ්‍ය ආදායම් වැඩිකර ගැනීමෙහිලා ගත් ක්‍රියාමාර්ග සාර්ථක ප්‍රතිඵල ලබා දී ඇත. 2022 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 8.2%ක් ව පැවති රාජ්‍ය ආදායම 2024 වර්ෂය වන විට 13.5%ක් දක්වා වැඩි විය. 2025 වර්ෂයේ දී එම ප්‍රතිශතය 15% ද ඉක්මවා ගොස් ඇත.

  - අයවැය ලේඛණයේ හිඟය සැලකිය යුතු ලෙස අඩු වී ඇත. 2024 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 6.8%ක් ව පැවති අයවැය හිඟය 2025 දී 4.5%ක් පමණ වෙතියි අපේක්ෂා කෙරේ.

  - ප්‍රාථමික ශේෂය අතිරික්තයක් කර ගැනීමට සමත් වී ඇත. 2024 දී එය දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමින් 2.2%ක් වූ අතර 2025 දී 2.3%ක් 2026 දී 2.5% ක් දක්වා වැඩි කර ගැනීමට අපේක්ෂිත ය

  - ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ද බොහෝ දුරට සාර්ථක ව නිමකොට ඇත.

- උද්ධමනය පාලනය කොට මිල ස්ථායිතාව රැක ගෙන ඇත.
  - 2022 වර්ෂයේ දී ඉතා ඉහළ අගයක පැවති උද්ධමන අනුපාතිකය 2024 වර්ෂය වන විට සෘණ අගයකට ආසන්න විය. වර්තමානයේ 2%කට වඩා අඩු මට්ටමක පවතී.

  - පොලී අනුපාතිකයන් ද සැලකිය යුතු තරම් පහළ අගයක පවත්වා ගෙන යාමට සමත් වී ඇත.

- විදේශ විනිමය වෙළෙඳපොළ ස්ථාවරත්වය
  - විනිමය අනුපාතිකය දැඩි උච්චාවචන වලින් තොර ව සාපේක්ෂ ව ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාමට රජය සමත් වී තිබේ.

(සාර්ව ආර්ථිකයේ සාධනය පෙන්නුම් කරන එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 03කට ලකුණු 03යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

- නව දුරටත් පවත්නා අභියෝග :
  - ව්‍යුහාත්මක දුර්වලතා සහ සාර්වග්‍රාහී වෘද්ධිය (inclusive growth) :
  - ආර්ථික වර්ධනය ප්‍රකෘතිමත් තත්ත්වයට පත් වෙමින් තිබුණ ද එය වැඩි දියුණු කළ ජීවන තත්ත්වයක් බවට පරිවර්තනය වී නැත. දරිද්‍රතාව ඉහළ මට්ටමක පවතී. ලෝක බැංකුවේ ගණනය කිරීමට අනුව 2024 දී ජනගහනයේ 24.5%ක් දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටියේ ය. සේවා නියුක්තිය අනුපාත සහ මූර්ත වැටුප් තවමත් අර්බුදයට පෙර තිබූ මට්ටමට වඩා පහළින් ඇත.

- සමාජයීය හා ව්‍යාප්ති ප්‍රතිවිපාක :
  - සාර්ව දර්ශක වැඩි දියුණු වෙමින් පැවැතිය ද බොහෝ කුටුම්බ තවමත් ආහාර අනාරක්ෂිතතාවය, ඉහළ මිල ගණන් සහ ශ්‍රම වෙළෙඳපොළ ගැටලුවලට මුහුණ දී සිටී.
  - මූර්ත වැටුප් 2019 පැවැති මට්ටමට වඩා අඩු ය.

- ණය තිරසාරභාවය හා මූල්‍ය අවදානම් :
  - ණය ප්‍රතිව්‍යුහගත කිරීම බොහෝ දුරට අවසන් ව තිබුණ ද රාජ්‍ය ණය හා රජය සහතික කළ ණය සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය තවමත් ඉහළින් පවතී.
  - රාජ්‍ය මූල්‍ය අවකාශය (fiscal space) දැඩි සීමාවන් තුළ පවතී. (ප්‍රාථමික අතිරික්ත ඉලක්ක පවත්වා ගැනීම සහ ප්‍රාථමික වියදම් සීමා නිසා)
  - අත්හදා බැලීම් කිරීමට තිබූ කිසිදු ඉඩක් නොමැති බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අවධාරණය කරයි.

- ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැගීමේ ප්‍රමාදය :
  - ප්‍රතිසංස්කරණ නෙහෙට්ටුවට (reform fatigue) එරෙහිව කටයුතු කිරීමේ අවශ්‍යතාව ජා.මූ.අ. අවධාරණය කොට ඇත.

- බාහිර අවදානම් :
  - බාහිර පරිසරය, අවිනිශ්චිතව පවතී. ගෝලීය වෙළෙඳ ප්‍රතිපත්ති කම්පන, ගෝලීය භාණ්ඩ මිල ගණන් සහ භූ දේශපාලනික ආතතීන් ශ්‍රී ලංකාවේ ප්‍රකෘතියට අවාසිදායක අවදානම් ඇති කරයි.
  - සංචිත වැඩි දියුණු වී ඇතත් විභව ආනයන අවශ්‍යතා සහ බාහිර කම්පනවලට සාපේක්ෂව ඒවා මධ්‍යස්ථ මට්ටමක පවතී.

(එක් අභියෝගයකට ලකුණු 01 බැගින් අභියෝග 2කට ලකුණු 02යි)

(මුළු ලකුණු 05යි)